# 1987 ආර්ථික ක්‍රියාකාරිත්වය, ගැටළු සහ ප්‍රතිපත්ති

## හැඳින්වීම

1987 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වයෙහි සැලකිය යුතු පසු බැසීමක් පෙනී ගියේය. මූර්ත වශයෙන් සලකා බලන කල, දළ දේශීය නිෂ්පාදිතය (ද. දේ. නි.) සියයට 1.5 කින් වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර, මෙය 1977 ආර්ථික ප්‍රතිසංස්කරණවලින් පසුව වූ අඩුම වර්ධන වේගය විය. 1977 සිට 1986 දක්වා වූ දස වසරක කාලපරිච්ඡේදය තුළ දී දළ දේශීය නිෂ්පාදිතයේ සාමාන්‍ය වර්ධන අනුපාතිකය සියයට 5.5 ක් විය. මේ අතර, විදේශයන් ගෙන් ලැබෙන ශුද්ධ සාධක ආදායමට ඉඩ හැරීමෙන් අනතුරුව ලබා ගන්නා ලද 1982 ස්ථාවර මිළ ගණන් අනුව වූ 1987 දළ ජාතික නිෂ්පාදිතය (ද.ජා.නි.) සියයට 1.6 ක වර්ධන අනුපාතිකයක් වාර්තා කළේය. ඉකුත් වර්ෂයේ මූර්ත දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන අනුපාතිකය සියයට 4.5 ක් විය.

**1 . 1 සංඛ්‍යා සටහන**

**ජාතික ආදායම් සංඛ්‍යා 1985 – 1987**


| ශීර්ෂය | වටිනාකම (රුපි. දශ ලක්ෂ) | | | වර්ධන අනුපාතිකය (සියයට) | |
|---|---|---|---|---|---|
| | 1985 | 1986* | 1987* | 1986 | 1987 |
| 1. පවත්නා සාධක වියදම් මිළ අනුව ද. දේ. නි. .. | 148,321 | 163,713 | 177,731 | 10·4 | 8·6 |
| 2. ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව ද. දේ. නි. .. | 109,570 | 114,261 | 115,922 | 4·3 | 1·5 |
| 3. පවත්නා සාධක වියදම් මිළ අනුව ද. ජා. නි. .. | 144,921 | 159,852 | 173,395 | 10·3 | 8·5 |
| 4. ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව ද. ජා. නි. .. | 106,741 | 111,565 | 113,307 | 4·5 | 1·6 |
| 5. මැදි වසර ජනගහණය ('000) .. | 15,837 | 16,117 | 16,361 | 1·8 | 1·5 |
| 6. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය (i) පවත්නා මිළ අනුව (රුපි.) .. | 9,151 | 9,918 | 10,598 | 8·4 | 6·9 |
| (ii) ස්ථාවර (1982) මිළ අනුව (රුපි.) .. | 6,740 | 6,922 | 6,925 | 2·7 | 0·1 |

* තාවකාලිකයි. මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1987 දී පවත්නා සාධක වියදම් මිළ අනුව, දළ ජාතික නිෂ්පාදිතය සියයට 8.5 ක වර්ධනයක් දක්වමින් රුපියල් කෝටි 17,340 ක් වී යැයි ඇස්තමේන්තු කර ඇත. ආර්ථිකයේ සමස්ත මිළ වෙනස්වීම මැනීම සඳහා භාවිතා කරනු ලබන දළ ජාතික නිෂ්පාදිත අවධමනකය වර්ෂය තුළ දී සියයට 6.8 කින් ඉහළ නැඟි අතර එය 1986 දී වාර්තා වූ සියයට 5.5 අනුපාතිකයට වඩා මඳක් වැඩි විය. ඒ අනුව, 1982 ස්ථාවර මිළ අනුව දළ ජාතික නිෂ්පාදිතය 1987 දී සියයට 1.6 ක වර්ධන අනුපාතිකයක් දක්වමින් රුපියල් කෝටි 11,330 ක් විය. වෙළෙඳ අනුපාතයෙහි ඇති වූ සුළු වර්ධනය නිසා, වෙළෙඳ අනුපාතයේ ඇති වන බලපෑම්වලට ගැලපීම් කිරීමෙන් අනතුරුව ලබා ගන්නා මූර්ත ජාතික ආදායම සියයට 2.1 ක මඳක් ඉහළ අනුපාතිකයකින් වැඩි විය.

රෙජිස්ට්‍රාර් ජෙනරාල් වරයාගේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, ශ්‍රී ලංකාවේ ජනගහණය 1987 දී දශ ලක්ෂ 16.4 දක්වා සියයට 1.5 කින් වැඩි වී ඇත. මෙම පදනම මත, පවත්නා මිළ ගණන් අනුව ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය 1987 දී රුපියල් 10,598 ක් (එක්සත් ජනපද ඩොලර් 360) වී යැයි ඇස්තමේන්තු කර ඇත. කෙසේ වුවද, මූර්ත වශයෙන් සළකා බලන කල, ඒක පුද්ගල ආදායම පෙන්නුම් කළේ සියයට 0.1 ක් පමණක් වූ ඉතා සුළු වැඩිවීමකි.

# දළ ජාතික නිෂ්පාදිතය




ශ්‍රී ලංකා මහ බැංකුව.

1987 දී ආර්ථිකයේ මඳ ක්‍රියාකාරිත්වය සාධක කිහිපයක ඒකාබද්ධ ප්‍රතිඵලයකි. ඉන් මූලිකත්වය ගන්නේ කෘෂිකාර්මික නිෂ්පාදනයේ වූ කැපී පෙනෙන පසු බැසීමය. අයහපත් කාලගුණික තත්ත්වයන්ගේ බලපෑම සහ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල අඛණ්ඩව පැවති ජනවාර්ගික කලබල නිසා, සමස්තයක් වශයෙන් ගත් කල, කෘෂිකාර්මික අංශයේ එකතු කළ අගය 1987 දී සියයට 8 කින් පහත වැටුණි. වැවිලි භෝග අතුරින් සියයට 1 ක නිෂ්පාදනයේ වැඩි වීමක් දක්වූ තේ අංශය පමණක් එක්තරා දියුණුවක් පෙන්නුම් කළේය. රබර් නිෂ්පාදනය සියයට 11 කින් පහත වැටුණු අතර පොල් නිෂ්පාදනය සියයට 25 කින් පහත වැටුණි. ආහාර භෝග අංශයේ, වී නිෂ්පාදනය සියයට 18 කින් අඩුවූ අතර, සීනි නිෂ්පාදනය සියයට 15 කින් අඩු විය. බලාපොරොත්තු වූ ආකාරයට වඩා අඩුවෙන් ක්‍රියාකාරී වූ තවත් අංශයක් වූයේ, 1986 දී වූ සියයට 4.3 ක වර්ධනය හා සසඳා බලන කල එකතු කළ අගය සියයට 2.7 කින් පමණක් වැඩි වූ සේවා අංශයයි.

1987 වර්ෂයේදී ආර්ථික වර්ධනයට කිසියම් අනුබලයක් ලබා දුන් අංශයන් අතර නිමැවුම් කර්මාන්ත අංශය සහ පතල් හා කැනීම් අංශය ද විය. නිමැවුම් කර්මාන්ත අංශයෙහි, පෞද්ගලික අංශයේ කර්මාන්තවල එකතු කළ අගය සියයට 13 කින් වැඩි වූ අතර, රජය සතු කර්මාන්තයන්හි එකතු කළ අගය සියයට 3 කින් පහත වැටුණි. මේ අතර, වැඩි වශයෙන්ම ඉහළ අගයන් එකතු කළ නිෂ්පාදිතවලට තේ නිෂ්පාදනය යොමු වීම නිසා, අපනයනය සඳහා වූ කෘෂිකාර්මික සැකසුම් කටයුතුවල සියයට 4 ක වර්ධනයක් වාර්තා කරනු ලැබීය. වර්ෂය තුළ දී පැකට්වල අසුරන ලද තේ නිෂ්පාදනය සියයට 15 කින් වැඩි විය. 1987 දී නිමැවුම් කර්මාන්ත අංශයෙහි සමස්ත නිෂ්පාදන වර්ධනය සියයට 7 ක් විය. මෙම වර්ධනයෙහි අතිශය විශාල කොටසක් ඇති වූයේ එම අංශයේ නිෂ්පාදනයෙහි වැඩි වැදගත්කමක් හිමි කරගනු ලබන නිපැයුම් කර්මාන්ත අංශයෙහිය. කාර්මික නිෂ්පාදන පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ සමීක්ෂණයට අනුව, කැපී පෙනෙන වැඩිවීම් දක්වූ කාර්මික කාණ්ඩ අතර රෙදිපිළි හා ඇඳුම් පැළඳුම්, මූලික ලෝහ නිෂ්පාදන, රසායනික ද්‍රව්‍ය සහ ලෝහමය නොවන ඛණිජ නිෂ්පාදනයන් ද විය. වැඩි වශයෙන්ම මැණික් කර්මාන්තයෙහි වූ යහපත් ක්‍රියාකාරිත්වය නිසා, පතල් හා කැනීම් අංශයෙහි නිෂ්පාදනය 1987 දී සියයට 19 කින් කැපී පෙනෙන පරිදි වැඩි විය.

**1 . 2 සංඛ්‍යා සටහන**

**දළ ජාතික නිෂ්පාදිතයේ සංයුතිය සහ වර්ධනය, 1985 – 1987**
**ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව**


| අංශය | වටිනාකම (රුපියල් දශ ලක්ෂ) | | | වර්ධන අනුපාතිකය | | |
|---|---|---|---|---|---|---|
| | 1985 | 1986* | 1987* | 1985 | 1986 | 1987 |
| 1. කෘෂිකර්මය, වන හා ධීවර .. | 28,366 | 29,106 | 27,409 | 8·6 | 2·6 | – 5·8 |
| 1.1 තේ .. | 2,759 | 2,723 | 2,750 | 2·9 | – 1·3 | 1.0 |
| 1.2 රබර් .. | 851 | 856 | 765 | –3·1 | 0·6 | –10·6 |
| 1.3 පොල් .. | 3,828 | 3,935 | 2,967 | 52·3 | 2·8 | –24·6 |
| 1.4 වී .. | 6,783 | 6,613 | 5,423 | 10·0 | – 2·5 | –18·0 |
| 1.5 අනෙකුත් (අතුරු භෝග, වන වගා හා ධීවර ඇතුළුව) .. | 14,145 | 14,979 | 15,504 | 1·9 | 5·9 | 3·5 |
| 2. පතල් සහ කැනීම් .. | 2,486 | 2,615 | 3,112 | 1·5 | 5·2 | 19·0 |
| 3. නිමැවුම් කර්මාන්ත .. | 16,193 | 17,558 | 18,748 | 5·2 | 8·4 | 6·8 |
| 3.1 වෘක්ෂ භෝග සැකසීම .. | 3,222 | 3,225 | 3,340 | 8·0 | 0.1 | 3·6 |
| 3.2 අනෙකුත් .. | 12,971 | 14,333 | 15,408 | 4·5 | 10.5 | 7·5 |
| 4. තැනීම් .. | 8,070 | 8,191 | 8,338 | 0·5 | 1.5 | 1·8 |
| 5. සේවා .. | 54,455 | 56,791 | 58,315 | 3·9 | 4.3 | 2·7 |
| 6. ද. දේ. නි. .. | 109,570 | 114,261 | 115,922 | 5·0 | 4.3 | 1·5 |
| 7. විදේශීය ශුද්ධ සාධක ආදායම .. | –2,829 | –2,696 | –2,615 | — | — | — |
| 8. ද. ජා. නි. .. | 106,741 | 111,565 | 113,307 | 5·3 | 4·5 | 1·6 |

* තාවකාලිකයි

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

# කාර්මික සම්භවය අනුව දළ ජාතික නිෂ්පාදිතය

ස්ථාවර (1982) සාධක වියදම් මිළ අනුව




ශ්‍රී ලංකා මහ බැංකුව.

ඉකුත් වර්ෂයේ සියයට 1.5 ක අඩු වර්ධනය හා සසඳා බලන කල 1987 දී කැනීම් අංශය සියයට 1.8 කින් පුළුල් විය. 1987 දී විදුලි බල, වායු, ජල සහ සෞඛ්‍යාරක්ෂක සේවාවන්හි නිෂ්පාදිතය සියයට 3 කින් වැඩි විය. මෙම අංශයේ සුළු වර්ධනයට වැඩි වශයෙන්ම හේතු වූයේ ජලාශ ආශ්‍රිත ප්‍රදේශවල වර්ෂාපතනය ප්‍රමාණවත් නොවීම නිසා ජල විදුලිබල උත්පාදනය සියයට 18 කින් පහත වැටීමය. තොග සහ සිල්ලර වෙළෙඳාමෙහි එකතු කළ අගය සියයට 2.8 කින් වැඩි වූ අතර, වැඩි වශයෙන්ම බැංකු අංශයේ වැඩි දියුණු වූ ක්‍රියාකාරිත්වය පිළිබිඹු කෙරෙමින් බැංකු, රක්ෂණ සහ නිශ්චල දේපලවල එකතු කළ අගය සියයට 6.1 ක ඉහළ ප්‍රමාණයකින් වැඩි විය. 1987 දී එකතු කළ අගයන්හි වර්ධනයක් වාර්තා කළ අනෙකුත් අංශයන් අතර වාසස්ථාන අයිතිය (සියයට 1.5) සහ වෙනත් සේවාවන් ද (සියයට 2.7) විය. 1986 සියයට 19 ක වර්ධනය හා සසඳා බලන කල, රාජ්‍ය පරිපාලන හා ආරක්ෂක කටයුතුවල එකතු කළ අගය සියයට 3 කින් සුළු වශයෙන් වැඩි විය.

1987 දී ප්‍රාග්ධන සම්පාදන අනුපාතිකයෙහි සුළු අඩුවීමක් ඇති විය. 1986 දී සියයට 10 ක වැඩිවීම හා සසඳා බලන කල, තොගවල වෙනස්වීම ඇතුළත් දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය (ද.දේ.ප්‍රා.ස.) සියයට 8 කින් වැඩි විය. පූර්ව වර්ෂයේදී මෙන්ම ප්‍රාග්ධන සම්පාදනයට වඩා කැපීපෙනෙන පරිදි දායක වූයේ, ඉකුත් වර්ෂයේ සියයට 23 ක වැඩිවීමට වඩා අඩු වුවද, සියයට 17 කින් දළ ප්‍රාග්ධන සම්පාදනයේ වර්ධනයක් ඇතිවූ රාජ්‍ය අංශයයි. ඉකුත් වර්ෂයේ සියයට 6.4 ක වැඩිවීම හා සසඳා බලන කල, දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙන් සියයට 76 කට දායක වූ පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය සංස්ථාවල ඒකාබද්ධ ප්‍රාග්ධන සම්පාදනය 1987 දී සියයට 5.6 කින් වැඩි විය. වෙළෙඳපල මිළ ගණන් අනුව වූ දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 1986 දී සියයට 23.6 සිට 1987 දී සියයට 23.3 දක්වා සුළු වශයෙන් පහත වැටුණි.

පසුගිය වර්ෂයේ සුළු පසුබෑමකට ලක් වූ තේ නිෂ්පාදනය, 1987 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 213 දක්වා සියයට 1 කින් මඳ වශයෙන් වැඩි විය. මෙය, මැදි හා පහත් බිම් තේ නිෂ්පාදනය වැඩිවීමේ හා උස් බිම් තේ නිෂ්පාදනය අඩුවීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි. උස් බිම් තේ නිෂ්පාදනය නොකඩවා තුන්වන වර්ෂයට ද පහත වැටුණු අතර, 1987 වර්ෂයේ පහත වැටීම සියයට 5 ක් විය. 1987 දී තේ නිෂ්පාදනයේ වැඩිවීම මුළුමනින්ම පෞද්ගලික අංශයේ සිදුවූ අතර, රජය සතු වතුවල නිෂ්පාදනය අඩු විය. ජනතා වතු සංවර්ධන මණ්ඩල (ජනවසම) සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි (ශ්‍රී.ලං.රා.වැ.සං.) ඒකාබද්ධ නිෂ්පාදනය 1987 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 123.2 දක්වා සියයට 3 කින් පහත වැටුණි. 1981 සිට දක්නට ලැබුණු උපනතිය අඛණ්ඩව පවත්වා ගෙන යමින්, පෞද්ගලික අංශයේ තේ නිෂ්පාදනය 1987 දී සියයට 10 කින් සිත් ගන්නා පරිදි වැඩි විය.

තේ නිෂ්පාදනයට ප්‍රතිවිරුද්ධව, 1987 දී රබර් නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 123 දක්වා සියයට 11 කින් සැලකිය යුතු පරිදි පහත වැටුණු අතර, මෙය පසුගිය දශක දෙක තුල වාර්තා වූ අඩුම නිෂ්පාදන මට්ටම විය. දැඩි නියං තත්ත්වයන් නිසා වර්ෂයේ පළමු කාර්තුවේදී නිෂ්පාදනය පහත වැටුණු අතර, තුන්වන කාර්තුවේදී ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල පැවති අධික වර්ෂාපතනය නිසා රබර් කිරි කැපීමට බාධා ඇති වුණි. නිෂ්පාදනයෙහි පහත වැටීම රාජ්‍ය අංශයෙහි මෙන්ම පෞද්ගලික අංශයෙහිද දක්නට ලැබුණි. ජනතා වතු සංවර්ධන මණ්ඩලයන්හි සහ ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි ඒකාබද්ධ නිෂ්පාදනය (මිළ දී ගත් රබර් කිරිවලින් කළ නිෂ්පාදනය හැර) සියයට 4 කින් පහත වැටුණු අතර, පෞද්ගලික අංශයේ නිෂ්පාදනය සියයට 13 කින් පහත වැටුණි. ඵලදාව අඩු වීම සහ කිරි කපන බිම් ප්‍රමාණය අඩුවීම යන කරුණු දෙකම 1987 නිෂ්පාදනයෙහි පසු බැසීමට හේතු විය. සාමාන්‍ය ඵලදාව හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 744 දක්වා සියයට 10 කින් අඩුවූ අතර, කිරි කපන ලද මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 1,65,565 දක්වා සියයට 1 කින් පහත වැටුණි. මෙය සැළකියයුතු කාලපරිච්ඡේදයකට පසුව වාර්තා වූ අඩුම බිම් ප්‍රමාණය විය.

1986 දී ගෙඩි දශ ලක්ෂ 3,039 ක වාර්තාගත මට්ටමක පැවති පොල් නිෂ්පාදනය, 1987 දී ගෙඩි දශ ලක්ෂ 2,292 දක්වා සියයට 25 කින් පහත වැටීමෙන් දැඩි පසුබෑමකට ලක් විය. වර්ෂයේ දෙවන භාගයේදී වඩාත් කැපී පෙනුණු නිෂ්පාදනයේ වූ මෙම පහත වැටීම, වැඩි වශයෙන්ම 1986 සහ 1987 වර්ෂවල ප්‍රධාන පොල් නිෂ්පාදන ප්‍රදේශවල පැවති නියං තත්ත්වයන්හි ප්‍රතිඵලයක් විය. අමතර සාධකයක් වූයේ පොල් මිළ ගණන් බෙහෙවින් පහත්ව පැවති 1985 සහ 1986 වර්ෂවල පොහොර භාවිතය අඩු වීමේ පසුකාලීන බලපෑමය. සාමාන්‍යයෙන් නියං කාල-පරිච්ඡේදවලදී පොහොර භාවිතය පහත වැටීමට නැඹුරු වේ. ගෙඩි නිෂ්පාදනයෙහි වූ දැඩි පහත වැටීම පිළිබිඹු කෙරෙමින් පොල් තෙල්, කපාපු පොල් සහ කොප්පරා යන ප්‍රධාන පොල් අපනයන ද්‍රව්‍යවල නිෂ්පාදනය පහත වැටුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 1987 දී ජාත්‍යන්තර වෙළෙඳපොලවල පොල් මිළ ගණන් සැළකිය යුතු පරිදි ඉහළ ගියද, ශ්‍රී ලංකාවට මෙම මිළ ගණන් වැඩිවීමේ මුළු වාසිය ලබාගත නොහැකි විය. 1987 දී පොල් මද සම්බන්ධ නිෂ්පාදන අපනයනයන් සියයට 51 කින් පහත වැටුණි.

පොල් නිෂ්පාදනයෙහි උපනතිය අනුව යමින්, 1987 දී වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 2.1 (බුසල් දශ ලක්ෂ 102) දක්වා සියයට 18 කින් පහත වැටුණි. මෙය නොකඩවා වී නිෂ්පාදනය පහත වැටුණු දෙවන වර්ෂය වූ අතර, 1987 නිෂ්පාදනය, 1979 න් පසුව වූ අඩුම නිෂ්පාදන මට්ටම විය. අපතේ යෑම් සහ බිත්තර වී අවශ්‍යතාවයන් සඳහා ඉඩ හැරීමෙන් පසු මෙට්‍රික් ටොන් දශ ලක්ෂ 1.3 ක් වීයැයි ඇස්තමේන්තු කර ඇති 1987 වී නිෂ්පාදනයට සමාන සහල් ප්‍රමාණය, ඇස්තමේන්තු කරන ලද මුළු වාර්ෂික පාරිභෝජන අවශ්‍යතාවයෙන් සියයට 80 ක් පමණ සපුරා ගැනීමට ප්‍රමාණවත් විය. 1986 වර්ෂයේ මීට අනුරූපී සංඛ්‍යාව සියයට 98 ක් විය. පොල් නිෂ්පාදනය සම්බන්ධයෙන් මෙන්ම, වී නිෂ්පාදනයේ තියුණු පසුබැසීමට ද ප්‍රධාන වශයෙන් හේතු වූයේ වර්ෂය තුළ දී ප්‍රධාන වී වගා ප්‍රදේශවල දිගටම පැවති නියං තත්ත්වයන්ය. උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල තවදුරටත් පැවති නොසන්සුන් තත්ත්වයන්ද නිෂ්පාදනයෙහි අඩුවීම කෙරෙහි බලපෑවේය. නිෂ්පාදනයේ අඩුවීම 1986/87 මහ සහ 1987 යල යන කන්න දෙකෙහිම පිළිබිඹු වූ අතර, කන්න දෙකෙහිම නිෂ්පාදනය සියයට 18 කින් පමණ පහත වැටුණි.

අයහපත් කාලගුණික තත්ත්වයන්ගේ බලපෑම හේතුකොට ගෙන වී වපුරන ලද දළ බිම් ප්‍රමාණය 1987 දී සියයට 13 කින් පහත වැටුණි. 1986/87 මහ කන්නයේදී වපුරන ලද දළ බිම් ප්‍රමාණය හෙක්ටයාර 5,07,830 දක්වා සියයට 9 කින් පහත වැටුණු අතර, යල කන්නයේදී වපුරන ලද බිම් ප්‍රමාණය හෙක්ටයාර 2,73,396 දක්වා සියයට 20 කින් පහත වැටුණි. වී වපුරන ලද බිම් ප්‍රමාණයේ සැළකිය යුතු අඩුවීම් වාර්තා වූ ප්‍රධාන වී නිෂ්පාදන දිස්ත්‍රික්කයන් අතර කුරුණෑගල, අනුරාධපුරය සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කයන් විය. ඉහළ වගා හානියක් පිළිබිඹු කෙරෙමින්, අස්වනු නෙලා ගන්නා ලද බිම් ප්‍රමාණය සියයට 19 ක විශාල ප්‍රමාණ-යකින් අඩු විය. අස්වනු නෙලා ගන්නා ලද මුළු දළ බිම් ප්‍රමාණය 1986/87 මහ කන්නයේදී සියයට 18 කින්ද, යල කන්නයේදී සියයට 20 කින්ද අඩු විය. 1987 වගා වර්ෂයේදී වපුරන ලද හා අස්වනු නෙලා ගන්නා ලද බිම් ප්‍රමාණය අතර වෙනස හෙක්ටයාර 1,02,479 ක් නැතහොත් වපුරන ලද දළ බිම් ප්‍රමාණයෙන් සියයට 13 ක් විය. කන්න දෙකෙහිම වැඩිම වගා හානියක් දක්නට ලැබුනේ දැඩි නියං තත්ත්වයට හසුවූ කුරුණෑගල දිස්ත්‍රික්කයෙහිය.

1987 දී දැඩි පසුබෑමකට ලක් වූ තවත් වගාවක් වූයේ උක් වගාවය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සීනි නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 29,304 දක්වා සියයට 15 කින් පහත වැටුණි. මෙම පහත වැටීම, නිෂ්පාදනය සියයට 29 කින් පමණ බෙහෙවින් අඩු වූ ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයට අයත් කම්හල්වලට සීමා විය. අනෙක් අතට, පෞද්ගලික අංශයේ සීනි නිෂ්පාදනය (පැල්වත්ත සීනි සමාගම) සියයට 9 කින් වැඩි වුණද, එය වර්ෂය සඳහා අපේක්ෂා කළ ඉලක්කයට වඩා බෙහෙවින් පහළ මට්ටමක පැවතුණි. ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයෙහි හා පැල්වත්ත සීනි සමාගමෙහි 1987 නිෂ්පාදනය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 15,035 සහ 14,269 ක් විය.

1987 දී සුළු ආහාර භෝග අංශයේ ක්‍රියාකාරිත්වය මිශ්‍ර ස්වරූපයක් ගනු ලැබීය. උඳු, මුංඇට, කව්පි, බඩඉරිඟු, තල සහ රතුළුනු වැනි භෝග කිහිපයක නිෂ්පාදනයෙහි සැළකිය යුතු වැඩිවීම් වාර්තා විය. නියඟය නිසා ජල සැපයුම හීන වන විට ගොවීන් වී වලට වඩා අඩුවෙන් ජලය අවශ්‍ය වන භෝග වගාවන් සඳහා නැඹුරුවන බව පෙනී යයි. කෙසේ වුවද, නිෂ්පාදනයෙහි අඩුවීම් වාර්තා වූ වැදගත් සුළු ආහාර භෝගයන් අතර අර්තාපල්, මිරිස් සහ බොම්බයි ළූනු ද විය.

පසුගිය වර්ෂයේ මෙන් 1987 දී මත්ස්‍ය නිෂ්පාදනය සියයට 4 ක වැඩිවීමක් වාර්තා කෙරෙමින් මෙට්‍රික් ටොන් 1,90,002 ක් වීයැයි ඇස්තමේන්තු කර ඇත. වෙරළබඩ, වෙරළින් ඈත, ගැඹුරු මුහුදු සහ මිරිදිය යන සෑම ධීවර අංශයක්ම නිෂ්පාදනයෙහි වූ මෙම වැඩිවීමට දායක විය. පෞද්ගලික අංශය නොකඩවා මෙරට මුළු මත්ස්‍ය නිෂ්පාදනයෙන් වැඩි කොටසකට දායක විය. තාවකාලිකව ඇස්තමේන්තු කර ඇති පරිදි 1987 දී කිරි නිෂ්පාදනය ලීටර් දශ ලක්ෂ 275 දක්වා සියයට 54 කින් තියුණු ලෙස වැඩිවී ඇති අතර, බිත්තර නිෂ්පාදනයද දශ ලක්ෂ 815 දක්වා සියයට 22 කින් වැඩිවී ඇත.

මෑත වර්ෂවල සැළකිය යුතු දියුණුවක් පෙන්වූ කාර්මික අංශයේ වර්ධන වේගය 1987 දීද අඛණ්ඩව පැවතුණි. මූර්ත වශයෙන් සළකා බලන කල, 1986 දී සියයට 12 ක සිත් ගන්නා සුළු අයුරකින් වර්ධනය වූ කාර්මික නිෂ්පාදිතයෙහි වටිනාකම 1987 දී සියයට 8 කින් තවදුරටත් පුළුල් විය. කාර්මික නිෂ්පාදිතයෙහි වර්ධනය මුළුමනින්ම හට ගැනුනේ සියයට 15 ක කැපී පෙනෙන වැඩි වීමක් දක්වූ පෞද්ගලික අංශයේ කර්මාන්තයන්හිය. මෙයට ප්‍රතිවිරුද්ධව, රාජ්‍ය අංශයේ කර්මාන්තයන්හි නිෂ්පාදිතයේ වටිනාකම සියයට 1 කින් පහත වැටුණි. ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය (සියයට 24), රාජ්‍ය ස්කාගාර සංස්ථාව (සියයට 21), බ්‍රිටිෂ් සිලෝන් කෝපරේෂන් (සියයට 16), ලංකා පිහන් සංස්ථාව (සියයට 7), ශ්‍රී ලංකා ටයර් සංස්ථාව (සියයට 4) සහ ජාතික පේෂකර්ම සංස්ථාව (සියයට 3) යන ආයතනයන්හි නිෂ්පාදනය පහත වැටීමය. රාජ්‍ය අංශයේ මුළු කාර්මික නිෂ්පාදනයෙන් විශාල කොටසක් අයත් වන ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවෙහි නිෂ්පාදනය ද ඉතා සුළු වශයෙන් වැඩි විය. රට තුළ පැවති නොසන්සුන් තත්ත්වයද රාජ්‍ය අංශයේ කර්මාන්ත කිහිපයක නිෂ්පාදනය කෙරෙහි අහිතකරව බලපෑවේය. නිෂ්පාදනයේ සැළකිය යුතු වැඩිවීම් වාර්තා කළ සංස්ථාවන් අතර තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලය (සියයට 89), රාජ්‍ය පතල් කැණීම් සහ ඛණිජ සංවර්ධන සංස්ථාව (සියයට 34), රාජ්‍ය ද්‍රව සංස්ථාව (සියයට 19), ශ්‍රී ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය (සියයට 11) සහ ශ්‍රී ලංකා වානේ සංස්ථාව (සියයට 11) ද විය.

පෞද්ගලික අංශයේ නිෂ්පාදනයෙහි වැඩිවීම් වාර්තා වූ අතුරු කාර්මික අංශයන් අතර රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම්, මූලික ලෝහ නිෂ්පාදන, රසායන ද්‍රව්‍ය සහ ලෝහමය නොවන ඛණිජ ද්‍රව්‍යයන්ද විය. කෙසේ වුවද, වඩාත්ම සැළකිය යුතු දායක වීම සිදු වූයේ අපනයන සලාකයන් වැඩි වශයෙන් ප්‍රයෝජනයට ගත් එමෙන්ම, ඉහළ එකතු කළ අගයන් සහිත භාණ්ඩ නිෂ්පාදනය සඳහා නිෂ්පාදන සංයුතිය වෙනස් කළ රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තයන්හිය. 1987 දී රෙදිපිළි හා ඇඟළුම් අපනයනයන්, කාර්මික අපනයනයන්හි මුළු වටිනාකමින් සියයට 65 කට දායක විය.

සිත්ගන්නා සුළු දිරිගැන්වීම්වල ප්‍රතිඵලයක් වශයෙන්, මෙරට සමහර ප්‍රදේශවල අඛණ්ඩව පැවති ජනවාර්ගික කලබල නොතකා 1987 දීද කර්මාන්ත අංශයේ ආයෝජනයන් වේගවත් විය. 1987 දී දේශීය ආයෝජන උපදේශක කමිටුව විසින් රුපියල් දශ ලක්ෂ 530 ක අපේක්ෂිත මුළු ආයෝජන වටිනාකමක් සහිත සහ ආසන්න වශයෙන් පුද්ගලයන් 14,500 කට රැකියා අවස්ථාවන් සැළසිය හැකි ව්‍යාපෘතීන් 364 ක් අනුමත කරන ලදී. එමෙන්ම, විදේශීය ආයෝජන උපදේශක කමිටුව විසින් ද රුපියල් දශ ලක්ෂ 672 ක අපේක්ෂිත ප්‍රාග්ධන ආයෝජන වටිනාකමකින් යුතු සහ පුද්ගලයන් 5,000 කට පමණ රැකියා සැපයිය හැකි යැයි තක්සේරුකර ඇති කාර්මික ව්‍යාපෘතීන් 41 ක් වර්ෂය තුළදී අනුමත කරන ලදී. 1986 දී දේශීය ආයෝජන

උපදේශක කමිටුව සහ විදේශීය ආයෝජන උපදේශක කමිටුව විසින් අනුමත කරන ලද ව්‍යාපෘතීන් සංඛ්‍යාව පිළිවෙලින් 321 ක් සහ 41 ක් විය. 1986 දී අනුමත කරන ලද ව්‍යාපෘතීන් 10 හා සසඳා බලන කල, මහ කොළඹ ආර්ථික කොමිසම විසින් ද 1987 දී ව්‍යාපෘතීන් 31 ක් අනුමත කරන ලදී. මෙම ව්‍යාපෘතීන්හි මුළු ආයෝජන වටිනාකම රුපියල් දශ ලක්ෂ 812 ක් වශයෙන්ද, රැකියා ලබාදිය හැකි පුද්ගලයන් සංඛ්‍යාව 8,970 ක් වශයෙන්ද ඇස්තමේන්තු කර ඇත.

වර්ෂය තුළදී රජයේ අයවැය මගින් කාර්මික සංස්ථාවන් වෙත කරන ලද සංක්‍රාමයන් මෑත කාලීන උපනතීන් අනුව යමින් අඩු මට්ටමක පැවතුණි. පසුගිය වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 473 ක සංක්‍රාමයන් හා සසඳා බලන කල, 1987 දී එවැනි සංක්‍රාමයන් රුපියල් දශ ලක්ෂ 290 ක් විය. 1987 දී කරන ලද සංක්‍රාමවලින් රුපියල් දශ ලක්ෂ 240 ක් (සියයට 83) ප්‍රාග්ධන සංක්‍රාම වූ අතර, රුපියල් දශ ලක්ෂ 50 ක් (සියයට 17) වර්තන සංක්‍රාමයන් විය. පසුගිය වර්ෂ දෙක තුළදී මෙන්ම, රජයේ අයවැය ලේඛනය මගින් කරන ලද රාජ්‍ය සංක්‍රාම වලින් පහෙන් හතරක්ම ලබා ඇත්තේ ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලය විසිනි.

1987 දී බලශක්ති අංශයේ වර්ධනයන් පසුගිය වර්ෂයේ අත්දුටු වාසිදායක උපනතීන්හි ආපසු හැරීමක් විය. ජලාශ ආශ්‍රිත ප්‍රදේශවල පැවති දිගු නියඟ නිසා ජලාශයන්හි වතුර මට්ටම බෙහෙවින් පහත් මට්ටමකට වැටීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ජල විදුලි බල උත්පාදනය මහත්සේ සීමා විය. මේ නිසා මෙරට බලශක්ති අවශ්‍යතාවයන් සපුරා ගැනීමට අවශ්‍ය බල උත්පාදනය සඳහා ඩීසල් සහ බර ඉන්ධන භාවිතය අධික තාප බලය මත රඳා පැවතීමට සිදු විය. ඇත්ත වශයෙන්ම, විදුලි බල උත්පාදනය සඳහා වූ බාධා වැඩිවීම නිසා ආර්ථික කටයුතු කෙරේ අහිතකර බලපෑම් ඇති කෙරෙමින් අගෝස්තු සහ ඔක්තෝබර් මාස අතරතුරදී දිවයින පුරා බලපාන අයුරින් පැය තුන හමාරකින් විදුලි බලය කපා හැරීමට සිදු විය. මේ අතර, ජාත්‍යන්තර වෙළෙඳපොලවල ඛණිජ තෙල් නිෂ්පාදිතයන්හි (බොර තෙල් ඇතුළුව) මිළ ගණන්ද වැඩි විය. ඒ නිසා ගෙවුම් තුලනය කෙරෙහි අහිතකරව බලපාමින් ඛණිජ තෙල් ආනයනය සඳහා වූ පිරිවැය සැළකිය යුතු පරිදි වැඩි විය. පසුගිය වර්ෂයේ සියයට 11 හා සසඳා බලන කල, මුළු ආනයනවලින් සියයට 14 ක් වූ ඛණිජ තෙල් ආනයන වියදම විගැහි අනුව සියයට 20 කින් වැඩි විය.

සිල්ලර මිළ ගණන්වල වැඩිවීම අනුව මනිනු ලබන උද්ධමන අනුපාතිකය පසුගිය වර්ෂයට වඩා 1987 දී සුළු වශයෙන් අඩු විය. 1986 දී වූ සියයට 8 ක වැඩිවීම හා සසඳා බලන කල, කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකයෙහි වැඩිවීමේ වාර්ෂික සාමාන්‍ය අනුපාතිකය සියයට 7.7 ක් විය. කෙසේ වුවද, එක් ලක්ෂයක සිට තවත් ලක්ෂයක් කරා වැඩිවීමේ පදනම (එනම්, 1986 දෙසැම්බර් මසට වඩා 1987 දෙසැම්බර් මස වැඩිවීම) අනුව සළකා බලන කල, 1987 අවසන් මාස කිහිපය තුළ මිළ ගණන්වල සැළකිය යුතු ඉහළ නැඟීමක් පිළිබිඹු කරමින්, මිළ දර්ශකය සියයට 10.2 කින් වැඩි විය. මෙම වෙනස්වීම් අනුව, 1987 අවසානය වනවිට ආර්ථිකයෙහි සැළකිය යුතු මිළ පීඩනයක් පැවති බැව් පෙනීයයි. ප්‍රථම කාර්තුවෙහි දී මිළ ගණන් බොහෝ සෙමින් වැඩිවූ අතර, දෙවන කාර්තුවෙහි දී තරමක වේගයකින් වැඩි විය. තුන්වන කාර්තු-වෙහි දී මිළ වැඩිවීමේ අනුපාතිකය අඩුවීම කෙරෙහි කාලීන සාධකයන් දායක වූ අතර, හතරවන කාර්තුවෙහි දී මිළ ගණන් සීඝ්‍ර වේගයකින් වැඩි විය.

1987 දී පාරිභෝගික මිළ ගණන් ඉහළ යාම සඳහා සාධක බොහොමයක් දායක වූ අතර, මෙය ආහාර කාණ්ඩයෙහි බෙහෙවින් කැපී පෙනුණි. ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශයන්හි පැවති අයහපත් කාලගුණික තත්ත්වයන් සහ උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන්හි නොවිසඳී පැවති තත්ත්වයන් නිසා වරින් වර හිඟයන් සහ මිළ වැඩිවීම් ඇති කෙරෙමින් සහල් සහ වියළි මිරිස් වැනි ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය අඩු විය. පොල් නිෂ්පාදනයෙහි වූ දැඩි පසුබෑම නිසා මිළ ගණන් තියුණු ලෙස වැඩි විය. ජාත්‍යන්තර වෙළෙඳපලවල මිළ වැඩි වීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් දේශීය සීනි මිළ

DISCARDED



ගණන් වැඩිවූ අතර, ගව මස්වල මිළ ගණන්ද වැඩි විය. නිෂ්පාදිත භාණ්ඩ සඳහා අවශ්‍යවන අමු ද්‍රව්‍යවල පිරිවැය සහ වේතනවල වැඩිවීම් අනුව මිළ ගණන් වෙනස් කිරීමට නිෂ්පාදකයෝ නැඹුරු වූහ. ඒ සමගම අධික සුරාබදුවල ප්‍රතිඵලයක් වශයෙන් දුම්කොළ සහ මද්‍යසාරවල මිළ ගණන් වැඩි වූ අතර, ජාත්‍යන්තර වෙළෙඳපලවල යහපත් මිළ ගණන් සහ විනිමය අනුපාතිකය පිරිහීම නිසා අපනයන භාණ්ඩයන්හි මිළ ගණන් ඉහළව පැවතුණි. රුපියලේ අගය පිරිහීම නිසා දේශීය මුදල් අනුව ආනයන මිළ ගණන් ඉහළ ගිය අතර, එය විදේශීය ශේෂය ආරක්ෂා කිරීමේ ක්‍රියාවලියෙහි නොවැලැක්විය හැකි ප්‍රතිඵලයක් විය. ඉල්ලුම් අංශයෙන් සළකා බලන කල, විශේෂයෙන්ම වර්ෂයේ අවසාන කාර්තුව තුළ දී බැංකු ණයවල වර්ධනය වේගවත් කෙරෙමින් මූල්‍ය ප්‍රතිපත්තියෙහි කිසියම් ලිහිල් කිරීමක් ඇති විය. අයවැය හිඟය නොකඩවා ප්‍රසාරණාත්මක විය. වර්ෂයේ අවසාන කාර්තුව තුළදී දේශීය සැපයුම් තත්ත්වයට බාධා පැමිණි අවස්ථාවක ඇතිවූ මෙම වර්ධනය නිසා සමස්ත ඉල්ලුම ඉහළ මට්ටමක පැවතුණි.

1987 දී නිෂ්පාදන මිළ ගණන්වල වැඩිවීම පාරිභෝගික මිළ ගණන්වල වැඩිවීමට වඩා තියුණු විය. 1985 දී සහ 1986 දී පිළිවෙලින් සියයට 15 ක සහ සියයට 3 ක අඩුවීම් වාර්තා කළ තොග මිළ දර්ශකය 1987 දී සියයට 13 කින් වැඩි විය. එක් ලක්ෂයක සිට තවත් ලක්ෂයක් දක්වා වූ පදනම මත, එනම් 1986 දෙසැම්බර් මස සිට 1987 දෙසැම්බර් මස දක්වා මෙම දර්ශකය සියයට 13 කින් වැඩි වී ඇත. කොළඹ පාරිභෝගිකයින්ගේ මිළ දර්ශකයෙහි මෙන්ම, තොග මිළ දර්ශකයෙහිද වර්ෂයේ අවසාන කාර්තුව තුළදී තියුණු වැඩිවීම් වාර්තා විය. තොග මිළ දර්ශකයෙහි තියුණු වැඩිවීම්වලට හේතු වූ ප්‍රධාන සාධකය වූයේ මෙම දර්ශකයෙහි වැඩි බරක් තබන ලද අපනයන භාණ්ඩ මිළ වැඩිවීමය.

1987 දී රජයේ සේවකයින්ගේ වැටුප් දර්ශකය 1986 ජනවාරි මට්ටමෙහි ස්ථාවරව පැවති අතර, සංවිධිත පෞද්ගලික අංශයේ සේවක ශ්‍රේණි කිහිපයකට වැටුප් වැඩිවීම් ලැබුණි. පඩි පාලක සභා මගින් ආවරණය වන වෘත්තීන්හි සේවකයින්ගේ අවම වැටුප් දර්ශකය, පසුගිය වර්ෂයේ වූ සියයට 5.4 ක වැඩිවීම හා සසඳා බලන කල, සියයට 6.3 ක සාමාන්‍ය ප්‍රමාණයකින් වැඩි විය. එසේ වුවද, මිළ මට්ටමෙහි තියුණු වැඩි වීමක පසුතලයක් යටතේ වර්ෂය තුළදී ඔවුන්ගේ මූර්ත වැටුප් සියයට 1.4 කින් පහත වැටුණි. 1987 දී කෘෂිකර්මාන්තයෙහි නියුතු සේවකයින්ගේ අවම වැටුප් දර්ශකය සියයට 4.9 කින් ඉහළ ගිය නමුදු, ඔවුන්ගේ මූර්ත වැටුප් සියයට 2.6 කින් පහත වැටුණි. පසුගිය වර්ෂයේ මෙන්ම, නාමික වැටුප්වල ඉහළම වැඩිවීම වන සියයට 14.3 කර්මාන්ත හා වාණිජ අංශයන්හි සේවකයන් ලබා ගත් හෙයින්, වර්ෂය තුළදී ඔවුන්ගේ මූර්ත වැටුප් සියයට 6.0 කින් වැඩි විය.

1987 දී පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය වැඩි වූ අතර, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය ඉකුත් වර්ෂයේ මට්ටමට වඩා සුළු වශයෙන් අඩු විය. තාවකාලික ඇස්තමේන්තු වලට අනුව 1987 අවසානය වනවිට රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තිය 11,94,000 දක්වා සියයට 1.5 කින් සුළු වශයෙන් පහත වැටුණි. රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තයන්ගෙන් ආසන්න වශයෙන් 7,49,000 ක් පමණ අර්ධ රාජ්‍ය ආයතනයන්හි ද, ඉතිරි 4,45,000 නියම රාජ්‍ය අංශයෙහි ද විය. රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි අඩුවීම, නියම රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි වැඩිවීමේ සහ අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිය අඩුවීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. ඒ ඒ අංශ අනුව වූ පදනම මත, 1987 දී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය වැඩිවූ අංශයන් නම් ආරක්ෂක සේවාවන්, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ රාජ්‍ය පරිපාලනයත්ය.

මෑත වර්ෂවල දක්නට ලැබුණු උපනතිය අනුව යමින්, 1987 අවසානය වනවිට අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තිය සියයට 2.4 ක සුළු අඩුවීමක් වාර්තා කරමින් මුළු සංඛ්‍යාව 7,49,000 ක් වීයැයි ඇස්තමේන්තු කර ඇත. කෙසේ වුවද, අර්ධ රාජ්‍ය අංශය තුළ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව හා රජයට පවරාගත් සීමාසහිත ගෑස් හා ජල කර්මාන්ත සමාගම වැනි

බලශක්ති හා සම්බන්ධ සංස්ථාවන් සහ ගමනා ගමන මණ්ඩල කිහිපයක සේවා නියුක්තිය වැඩි වූ අතර, රාජ්‍ය වැවිලි සංස්ථාවන්හි සහ තැනීම් කටයුතු හා සම්බන්ධ සංස්ථාවන්හි සේවා නියුක්තිය පහත වැටුණි.

සේවක අර්ථ සාධක අරමුදල හා වෙනත් අනුමත අර්ථ සාධක අරමුදල්වල වාර්තාවන්ට අනුව, 1987 අවසානය වනවිට සංවිධිත පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය සියයට 1 ක සුළු වැඩි වීමක් දක්වමින් 3,30,000 ක් පමණ වීයැයි ඇස්තමේන්තු කර ඇත. මෑත වර්ෂවල දක්නට ලැබුණු සතුටුදායක උපනතිය අඛණ්ඩව පවත්වා ගෙන යමින් සමාලෝචනයට ලක්ව ඇති වර්ෂය තුළදී මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ සැළකෙන ව්‍යාපාරයන්හි සේවා නියුක්තිය වැඩි විය. 1987 අවසානය වනවිට මහ කොළඹ ආර්ථික කොමිසමේ ව්‍යාපාරයන්හි සේවයේ යෙදී සිටි මුළු සංඛ්‍යාව 50,744 ක් වීයැයි වාර්තා වී ඇති අතර එය පසුගිය වර්ෂයේ පැවති මට්ටමට වඩා සියයට 12.6 ක වැඩි වීමකි.

වැවිලි කෘෂිකාර්මික අංශයේ නිෂ්පාදන වර්ධනයෙහි පසු බැසීමක් ඇති වුවද, 1987 දී විදේශ වෙළෙඳ අංශයේ වර්ධනයන් මුළුමනින්ම අයහපත් නොවීය. 1986 ට වඩා විගැහි අනුව අපනයන වටිනාකම සියයට 4 කින් වැඩිවූ අතර, ආනයන වියදම සියයට 4 කින් පහත වැටුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, 1987 දී වෙළෙඳ ගිණුමේ හිඟය සියයට 18 කින් පහත වැටුණි. එනමුදු, අඩුවූ ප්‍රාග්ධන ලැබීම් අනුව සළකා බලන කල, 1987 වෙළෙඳ හිඟය විදේශ වත්කම් කෙරෙහි පීඩනයක් ඇති කිරීමට තරම් විශාල විය.

1987 දී අපනයන අංශයේ වැඩි දියුණු වූ ක්‍රියාකාරිත්වයට වැඩි වශයෙන්ම හේතු වූයේ කාර්මික අපනයනයන් හා මැණික් අපනයනයන් මගින් ලද ඉහළ ඉපැයීම්ය. මූර්ත වශයෙන් සළකා බලන කල තේ, රබර් සහ පොල් නිෂ්පාදනවල මිළ ගණන් වැඩි වුනද, අඩුවූ අපනයන පරිමාවන් නිසා කෘෂිකාර්මික අපනයනයන් මගින් ලද ඉපැයීම් විගැහි අනුව සියයට 5 කින් පහත වැටුණි. පරිමාව සහ මිළ ගණන් යන දෙකම වැඩිවීම නිසා ආනයන අංශයේ ඛණිජ තෙල් ආනයන වටිනාකමෙහි සැළකිය යුතු වැඩි වීමක් ඇති විය. කෙසේ වුවද, මූර්ත වශයෙන් සළකා බලන කල, පාරිභෝගික භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩවල වටිනාකම පහත වැටීමේ ප්‍රතිඵලයක් වශයෙන් විගැහි අනුව වටිනාකමෙහි සමස්ත අඩු වීමක් ඇති විය.

ගැලපීම් කළ රේගු දත්තයන්ට අනුව, 1986 දී වූ රුපියල් දශ ලක්ෂ 34,072 (විගැහි දශ ලක්ෂ 1,036) හා සසඳා බලන කල, 1987 දී අපනයනවල වටිනාකම විගැහි අනුව සියයට 4 කද, රුපියල් අනුව සියයට 21 කද වැඩි වීමක් වාර්තා කරමින් රුපියල් දශ ලක්ෂ 41,133 ක් (විගැහි දශ ලක්ෂ 1,080) වී යැයි ඇස්තමේන්තු කර ඇත. 1985 සහ 1986 වර්ෂවල අපනයනයන්හි, රුපියල් මෙන්ම විගැහි අගය අනුවද වූ අඩුවීම් පිළිබඳව සළකා බලන කල, මෙය සිත්ගන්නා සුළු වර්ධනයක් විය. 1987 දී වඩා යහපත් වූ අපනයන ක්‍රියාකාරිත්වයකට ප්‍රධාන වශයෙන්ම අනුබලය ලැබුනේ කාර්මික සහ ඛණිජ අපනයනයන්ගෙනි. කාර්මික අපනයනයන්හි වටිනාකම 1986 දී වූ රුපියල් දශ ලක්ෂ 15,878 (විගැහි දශ ලක්ෂ 483) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 20,004 (විගැහි දශ ලක්ෂ 525) දක්වා වැඩිවූ අතර, ඛණිජ අපනයන රුපියල් දශ ලක්ෂ 1,182 (විගැහි දශ ලක්ෂ 36) සිට රුපියල් දශ ලක්ෂ 1,758 (විගැහි දශ ලක්ෂ 46) දක්වා වැඩි විය. විගැහි අනුව කෘෂිකාර්මික අපනයන ඉපැයීම් පහත වැටුණි. මෙයට හේතු වූයේ 1987 දී ශ්‍රී ලංකාවේ අපනයන ක්‍රියාකාරිත්වයෙහි බලාපොරොත්තු කඩවන සුළු ලක්ෂණයක් වූ ප්‍රධාන කෘෂිකාර්මික භාණ්ඩ තුනෙහි අපනයන පරිමාව තියුණු ලෙස අඩුවීමය. 1987 දී තේ අපනයන පරිමාව කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 201 දක්වා සියයට 3 කින් පහත වැටුණු අතර, රබර් අපනයන පරිමාව කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 106 දක්වා සියයට 4 කින් පහත වැටුණි. පොල් මද නිෂ්පාදනයන්ගේ මුළු අපනයන පරිමාව, ගෙඩි වශයෙන් ගණනය කළ විට 1986 දී ගෙඩි දශ ලක්ෂ 1,105 සිට 1987 දී ගෙඩි දශ ලක්ෂ 538 දක්වා අඩු විය. මෙම අඩුවීම හේතු කොට ගෙන ජාත්‍යන්තර වෙළෙඳපලෙහි එම වෙළෙඳ ද්‍රව්‍ය

සඳහා පැවති මිළ ගණන් ඉහළ නැඟීමේ වාසිය ලබා ගැනීමට ශ්‍රී ලංකාව අපොහොසත් විය. විගැහි වටිනාකම අනුව වූ අපනයන ඉපැයීම්, තේ සඳහා සුළු වශයෙන්ද, රබර් සඳහා සියයට 4 කින්ද, පොල් සඳහා සියයට 23 කින්ද අඩු විය. කෘෂිකාර්මික අපනයනයන්ගේ මිළ ගණන්වල වර්ධනයක් පැවති නමුත් එම අපනයනයන්ගේ සමස්ත ඉපැයුම් 1986 දී විගැහි දශ ලක්ෂ 479 සිට 1987 දී විගැහි දශ ලක්ෂ 458 දක්වා සියයට 5 කින් පහත වැටුණි.

මෑත වර්ෂවල දී අපනයන අංශයෙහි කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ, කාර්මික අපනයනයන්හි සිදුවූ ක්‍රමික ප්‍රසාරණයයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් මෙම කාණ්ඩයේ අපනයන 1986 වන විට ප්‍රබල තත්ත්වයකට පත් විය. 1987 දී කාර්මික අපනයනයන්ගෙන් ලද ඉපැයීම් 1986 දී වූ රුපියල් දශ ලක්ෂ 15,878 (විගැහි දශ ලක්ෂ 483) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 20,004 (විගැහි දශ ලක්ෂ 525) දක්වා සියයට 26 කින් (විගැහි අනුව සියයට 9) ඉහළ නැඟුණි. මෙම වැඩිවීමත් සමග, මුළු අපනයනයන්හි කාර්මික අපනයනවල කොටස පසුගිය වසරේදී පැවති සියයට 47 සිට සියයට 49 දක්වා වැඩි විය. කාර්මික අපනයනවල වර්ධනය බෙහෙවින් පිළිබිඹු වූයේ රෙදිපිළි හා ඇඟළුම් අපනයනයන්හිය. මෙම අපනයන ඉපැයීම් 1986 දී පැවති රුපියල් දශ ලක්ෂ 9,629 (විගැහි දශ ලක්ෂ 293) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 12,897 (විගැහි දශ ලක්ෂ 339) දක්වා සියයට 34 කින් (විගැහි අනුව සියයට 16 ක) පැසසිය යුතු අයුරින් වැඩි විය. ගතික බවක් පෙන්නුම් කළ තවත් අපනයන වර්ගයක් වූයේ 1986 දී වටිනාකම රුපියල් දශ ලක්ෂ 755 ක (විගැහි දශ ලක්ෂ 23) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 1,447 (විගැහි දශ ලක්ෂ 38) දක්වා සියයට 92 කින් (විගැහි අනුව සියයට 65) වැඩි වූ මැණික් අපනයනයන්ය. මෙම ඉපැයීම්වල වර්ධනය අපනයන පරිමාවේ ඉහළ යාම හා සතුටුදායක මිළ ගණන් යන දෙයාකාරයෙන්ම පිළිබිඹු විය. අපනයන පරිමාව 1986 දී වූ කැරට් දශ ලක්ෂ 4.9 සිට 1987 දී කැරට් දශ ලක්ෂ 5.4 දක්වා සියයට 10 කින්ද, සාමාන්‍ය නැ.වි.ස. මිළ 1986 දී කැරට් එකක් රුපියල් 154 සිට 1987 දී කැරට් එකක් රුපියල් 267 දක්වා සියයට 73 කින්ද වැඩි විය. 1986 දී පැවති සියයට 2.2 ක් හා සසඳන කල, මුළු අපනයනයන්හි මැණික් අපනයනවල කොටස 1987 දී සියයට 3.5 ක් විය.

ගැලපීම් කළ රේගු දත්ත අනුව, 1986 දී පැවති රුපියල් දශ ලක්ෂ 54,559 ක් (විගැහි දශ ලක්ෂ 1,658) හා සසඳන කල, 1987 දී ආනයන වියදම රුපියල් දශ ලක්ෂ 60,517 ක් (විගැහි දශ ලක්ෂ 1,588) විය. රුපියල් අනුව මෙහි සියයට 11 ක වර්ධනයක් පිළිබිඹු කෙරුණද, විගැහි අනුව එය සියයට 4 ක පහත වැටීමක් විය. මෙම පහත වැටීම විශාල වශයෙන් පිළිබිඹු වූයේ පාරිභෝගික භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ ආනයනයන්හිය. පාරිභෝගික භාණ්ඩ ආනයනය සඳහා වූ වියදම විගැහි දශ ලක්ෂ 362 දක්වා සියයට 3 කින් (විගැහි අනුව) පහත වැටුනද, රුපියල් අගය අනුව රුපියල් දශ ලක්ෂ 13,804 දක්වා සියයට 13 කින් වැඩි විය. විගැහි අනුව ඇතිවූ මෙම අඩුවීම පාරිභෝගික භාණ්ඩ ආනයනයන්හි සෑම කාණ්ඩයක් තුළින් ම පිළිබිඹු විය. විශේෂයෙන්ම, ආහාර හා බීම ආනයනයන් විගැහි දශ ලක්ෂ 196 දක්වා සියයට 5 කින් අඩුවූ අතර, ඉන් විශාල කොටසක් සහල් ආනයනය තියුණු ලෙස පහත වැටීම නිසා සිදු විය. කෙසේ වුවද, පාරිභෝගික භාණ්ඩ ආනයන කාණ්ඩය තුළ, සීනි සඳහා වූ ආනයන වියදම 1986 දී වූ විගැහි දශ ලක්ෂ 54 සිට 1987 දී විගැහි දශ ලක්ෂ 63 දක්වා සියයට 17 කින් වැඩි විය. මෙය මිළ හා පරිමාව යන සාධක දෙකෙහිම බලපෑම නිසා සිදු විය.

විගැහි අනුව සියයට 7 ක අඩුවීමක් පෙන්නුම් කරමින්, එහෙත් රුපියල් වටිනාකම අනුව සියයට 7 ක මධ්‍යස්ථ වැඩි වීමක් වාර්තා කරමින් 1987 දී ආයෝජන භාණ්ඩ ආනයන සඳහා වූ වියදම රුපියල් දශ ලක්ෂ 11,332 ක් (විගැහි දශ ලක්ෂ 297) විය. ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ ආනයනයන් විගැහි අනුව, පිළිවෙලින් සියයට 33 කින් හා සියයට 16 කින් තියුණු ලෙස පහත වැටුණු අතර, යන්ත්‍ර හා උපකරණ ආනයනයන්ද සියයට 2 කින් සුළු වශයෙන් පහත වැටුණි.

පාරිභෝගික හා ආයෝජන භාණ්ඩ ආනයනයන්ට ප්‍රතිවිරුද්ධව, රුපියල් දශ ලක්ෂ 34,619 ක් (විගැහි දශ ලක්ෂ 909) වූ අන්තර් භාණ්ඩ ආනයන වියදමෙහි රුපියල්වලින් මෙන්ම විගැහි වලින් ද වැඩිවීම වාර්තා විය. රුපියල් අනුව ඒවායේ වූ වැඩිවීම සියයට 21 ක් වූ අතර, විගැහි අනුව එය සියයට 4 ක් විය. මීට විශාල වශයෙන්ම හේතු වූයේ මිළ මෙන්ම පරිමාව වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඛණිජ තෙල් ආනයන වටිනාකම ඉහළ යාමය. ඛණිජ තෙල් ආනයන 1986 දී වූ රුපියල් දශ ලක්ෂ 6,293 (විගැහි දශ ලක්ෂ 191) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 8,716 (විගැහි දශ ලක්ෂ 229) දක්වා ඉහළ නැඟුණි. 1986 දී බැරල් දශ ලක්ෂ 12.1 ක් වූ බොර තෙල් ආනයන ප්‍රමාණය 1987 දී බැරල් දශ ලක්ෂ 13.1 දක්වා වැඩි වූ අතර, ඒවායේ සාමාන්‍ය ආනයන මිළද 1986 දී බැරලයක් විගැහි 13.3 සිට 1987 දී බැරලයක් විගැහි 14.3 දක්වා ඉහළ නැඟුණි. මෙම අංශය තුළ දක්නට ලැබුණු තවත් කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ වැඩි වශයෙන්ම ඇඟළුම් කර්මාන්තයේ අමු ද්‍රව්‍ය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා රෙදිපිළි හා ඇඟළුම් ආනයනයන් වැඩිවීමය. මෙම ආනයනයන්ගේ වටිනාකම 1986 දී රුපියල් දශ ලක්ෂ 6,353 ක් (විගැහි දශ ලක්ෂ 193) වූ අතර, එය 1987 දී රුපියල් දශ ලක්ෂ 8,086 ක් (විගැහි දශ ලක්ෂ 212) දක්වා ඉහළ නැඟුණි.

## 1.3 සංඛ්‍යා සටහන

### ගෙවුම් තුලන සාරාංශය 1984 – 1987

රුපියල් දශ ලක්ෂ (වරහන් තුළ විගැහි දශ ලක්ෂ)

| ශීර්ෂ | 1984(අ) | 1985 | 1986(අ) | 1987(ආ) |
|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩ (ශුද්ධ) | - 850 (- 453) | - 19,801 (- 711) | - 21,390 (- 649) | - 20,743 (- 531) |
| සාධක නොවන සේවා (ශුද්ධ) | 1,666 (64) | - 201 (- 8) | 255 (8) | 79 (1) |
| සාධක සේවා (ශුද්ධ) | - 3,401 (- 130) | - 3,445 (- 125) | - 3,871 (- 117) | - 4,336 (- 115) |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 7,031 (270) | 7,212 (262) | 7,982 (242) | 9,161 (240) |
| නිල සංක්‍රාම (ශුද්ධ) | 5,154 (198) | 4,828 (172) | 5,114 (153) | 5,302 (139) |
| ජංගම ගිණුමේ ශේෂය | - 1,400 (- 51) | - 11,408 (- 410) | - 11,910 (- 363) | - 10,537 (- 266) |
| සමස්ත ශේෂය | + 7,062 (+297) | - 1,060 (- 110) | - 2,124 (- 74) | - 1,801 (- 72) |

ප්‍රධාන දර්ශක සමහරක්

| | | | | |
|---|---|---|---|---|
| වෙළෙඳ අනුපාතය (1981 = 100) | 140 | 115 | 111 | 114 |
| ශුද්ධ ඛණිජ තෙල් ආනයන | 7,394 (284) | 7,109 (257) | 3,935 (120) | 6,124 (160) |
| ජංගම ගිණුමේ හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් | 0·9 | 6·9 | 6·6 | 5·2 |
| දළ ජාත්‍යන්තර සංචිත | 18,942 (735) | 18,367 (611) | 17,152 (492) | 18,134 (415) |
| ජාත්‍යන්තර සංචිත වලින් කළ හැකි ආනයන මාස ගණන (ඇ) | 4·4 | 4·4 | 3·7 | 2·9 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) ඉදිරි වර්ෂයේ ආනයන සඳහා, විගැහි අනුව ඇස්තමේන්තු කර ඇත.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

වෙළෙඳ සහ ජංගම ගිණුම යන දෙකෙහිම වූ ශේෂයන් අනුව සළකා බලන කල, 1987 දී ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනය කිසියම් ප්‍රගතියක් වාර්තා කළේය. වෙළෙඳ භාණ්ඩ ගිණුමේ හිඟය 1986 දී විගැහි දශ ලක්ෂ 649 සිට 1987 දී විගැහි දශ ලක්ෂ 531 දක්වා අඩු විය. ඒ අනුව යමින්, ජංගම ගිණුමේ හිඟය විගැහි දශ ලක්ෂ 363 සිට විගැහි දශ ලක්ෂ 266 දක්වා අඩු වූ අතර, ගෙවුම් තුලනය මත වූ පීඩනය සුළු වශයෙන් අඩු වූ බවක් දක්වමින් මෙම හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් වශයෙන් 1986 දී සියයට 6.6 සිට 1987 දී සියයට 5.2 දක්වා පහත වැටුණි. කෙසේ වුවද, 1987 දී ද සමස්ත ශේෂය හිඟ ශේෂයක් වූ අතර, එය විගැහි දශ ලක්ෂ 72 ක් විය. විදේශ සංචිතයන් අඩුකරලමින් පිළිවෙලින් සමස්ත ශේෂයෙහි හිඟයක් ඇති වූ තුන්වන වසර මෙය විය. පසුගිය වර්ෂ තුන තුළදී සමස්ත ශේෂයේ ඇති වූ සමුච්චිත හිඟය විගැහි දශ ලක්ෂ 257 ක් පමණ විය.

1986 දී විගැහි දශ ලක්ෂ 109 සිට 1987 දී විගැහි දශ ලක්ෂ 114 දක්වා හිඟය වැඩිවීම නිසා ගෙවුම් ශේෂයේ සේවා ගිණුමෙහි තත්ත්වය 1987 දී ද තවදුරටත් පහත වැටුණි. මෙයට සම්පූර්ණ වශයෙන්ම හේතු වූයේ සංචාරක ඉපැයීම් තියුණු ලෙස පහත වැටීමය. 1987 දී සංචාරකයින්ගේ පැමිණීම සියයට 21 කින් පහත වැටුණු අතර, සංචාරක කර්මාන්තයෙන් වූ ලැබීම් 1986 දී විගැහි දශ ලක්ෂ 71 සිට 1987 දී විගැහි දශ ලක්ෂ 48 දක්වා සියයට 32 කින් අඩු විය.

කෙසේ වුවද, 1987 දී ගෙවුම් තුලනයේ සේවා ගිණුමෙහි හිතකර වර්ධනයන් සමහරක්ද විය. පසුගිය වර්ෂ දෙක තුළ හිඟ ශේෂයක් පැවති වරාය, ප්‍රවාහන හා රක්ෂණ අංශයෙහි 1987 දී විගැහි දශ ලක්ෂ 8 ක අතිරික්තයක් ඇති විය. මෙයට හේතු වූයේ වරායෙන් ලද ලැබීම් වැඩිවීම, ගුවන් යානා ගාස්තු අඩුවීම සහ එයාර් ලංකා සමාගම මගින් ඉන්ධන සඳහා ගෙවීම අඩුවීම යන කරුණුය.

තවත් කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ, වැඩි වශයෙන්ම ජාත්‍යන්තර වෙළෙඳපොලවල පොළී අනුපාතිකයන් අඩුවීම නිසා ආයෝජන ආදායම් ගිණුමෙහි හිඟය අඩු වීමය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ඇතුළු විදේශ ණය සඳහා වූ පොළී ගෙවීම් සහ අනෙකුත් සේවා ගාස්තු 1986 දී විගැහි දශ ලක්ෂ 159 සිට 1987 දී විගැහි දශ ලක්ෂ 156 දක්වා සුළු වශයෙන් පහත වැටුණි. 1987 දී ලාභ සහ ලාභාංශ ගෙවීම් ද අඩු විය.

පෞද්ගලික ප්‍රේෂණ හේතුකොට ගෙන විදේශීය විනිමය රට තුළට ගලා ඒම මෑත වර්ෂවල ගෙවුම් තුලනයට ආධාර වූ ප්‍රධාන මූලාශ්‍රයක් විය. එහෙත්, ඛණිජ තෙල් මත රැඳී සිටින බටහිර ආසියානු ආර්ථිකයන්ගේ සංකෝචනය අනුව මෙම ප්‍රේෂණයන්හි තරමක අඩුවීමක් අපේක්ෂා කෙරිණි. ඒ අනුව, 1986 දී විගැහි වශයෙන් සියයට 6 කින් පහත වැටුණු එම ප්‍රේෂණ තවදුරටත් සුළු අඩුවීමක් වාර්තා කරමින් 1987 වර්ෂයේදී විගැහි දශ ලක්ෂ 268 දක්වා විගැහි දශ ලක්ෂයකින් පහත වැටුණි. කෙසේ වුවද, මෙම ප්‍රේෂණයන්හි රුපියල් අගය 1987 දී රුපියල් දශ ලක්ෂ 10,255 ක් දක්වා සියයට 16 කින් වැඩි විය. මේ අතර, පිළිවෙලින් දෙවන වසරටත් යෝජනා ක්‍රම හා ද්‍රව්‍ය ආධාර ඇතුළත් නිල සංක්‍රාම 1987 දී ද පහත වැටුණි. 1985 දී විගැහි දශ ලක්ෂ 172 සිට 1986 දී විගැහි දශ ලක්ෂ 153 දක්වා අඩු වූ එම සංක්‍රාම 1987 දී විගැහි දශ ලක්ෂ 139 දක්වා තවදුරටත් අඩු විය. මෙම වර්ධනයන්හි ශුද්ධ ප්‍රතිඵලය වූයේ පෞද්ගලික හා නිල යන දෙයාකාරයෙන්ම වූ මුළු ශුද්ධ සංක්‍රාම ලැබීම් විගැහි අනුව සියයට 4 කින් පහත වැටීමය.

1987 දී සංක්‍රාම වශයෙන් වූ ශුද්ධ ලැබීම්, භාණ්ඩ හා සේවාවල හිඟයෙන් සියයට 59 ක් පියවීමට ප්‍රමාණවත් වූ අතර, එය 1986 දී පැවති සියයට 52 හා සැසඳිය යුතුය. මෙසේ පසුගිය වසරට වඩා ජංගම ගිණුමෙහි හිඟය අඩුකිරීමට එකී ලැබීම් දායක විය. 1986 දී පැවති විගැහි දශ ලක්ෂ 363 ක හිඟයකට එරෙහිව, 1987 දී සියයට 27 ක අඩුවීමක් පිළිබිඹු කළ ජංගම ගිණුමෙහි හිඟය, විගැහි දශ ලක්ෂ 266 ක් වූ බවට තක්සේරු කර ඇත. මෙය පිළිවෙලින් ජංගම ගිණුමේ ශේෂයෙහි වැඩි දියුණු වීමක් වාර්තා වූ දෙවන වසර වුවද, එය තවදුරටත් සැළකිල්ල යොමු විය

යුතු මට්ටමක පවතී. දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් වශයෙන් ජංගම ගිණුමේ හිඟය 1985 දී වූ සියයට 6.9 සිට 1986 දී සියයට 6.6 දක්වාද, 1987 දී සියයට 5.2 දක්වාද පහත වැටුණි.

1982 සිට පහත වැටීමේ නැඹුරුවක් දක්වූ මූල්‍ය නොවන ප්‍රාග්ධන ලැබීම් 1987 දී සියයට 33 කින් අඩුවීම නිසා තවදුරටත් එබඳු ලැබීම් වල පසුබෑමක් සිදු විය. මෙයට විශාල වශයෙන්ම හේතු වූයේ සියයට 42 කින් පහත වැටුණු නිල ප්‍රාග්ධන ලැබීම්වල අඩු වීමය. 1986 දී පැවති විගැහි දශ ලක්ෂ 251 හා සසඳන කල 1987 දී ශුද්ධ නිල ප්‍රාග්ධන ලැබීම් වූයේ විගැහි දශ ලක්ෂ 146 කි. යෝජනා ක්‍රම හා භාණ්ඩ යන ණය පහසුකම් දෙවර්ගයේම මෙම අඩු වීම දක්නට ලැබුණි. අනෙක් අතට, 1986 දී විගැහි දශ ලක්ෂ 28 ක් වූ ශුද්ධ පෞද්ගලික ප්‍රාග්ධන ලැබීම් 1987 දී විගැහි දශ ලක්ෂ 41 දක්වා ඉහළ නැඟුණි.

මූල්‍ය නොවන ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් මගින් පියවා දැමීමට හැකි වූයේ ජංගම ගිණුමේ හිඟයෙන් සියයට 70 ක් පමණක් වූ හෙයින්, 1987 දී විගැහි දශ ලක්ෂ 72 ක්වූ සමස්ත හිඟය විදේශීය වත්කම් පහත හෙළීමෙන් පියවා දැමීමට සිදු විය. ඒ අනුව, මෙම වසරේදී දළ විදේශීය වත්කම් සියයට 15 කින් පහත වැටුණි. මෙය ශ්‍රී ලංකාවෙහි දළ විදේශීය වත්කම්වල පහත වැටීමක් නොකඩවා වාර්තා වූ තෙවන වසර වූ අතර, 1985 හා 1986 වර්ෂ වලදී වූ පහත වැටීම් පිළිවෙලින් සියයට 17 ක් හා සියයට 19 ක් විය. 1986 අවසානයේදී පැවති විගැහි දශ ලක්ෂ 492 (රුපියල් දශ ලක්ෂ 17,152) හා සසඳා බලන කල, 1987 අවසානය වනවිට දළ විදේශීය වත්කම් ප්‍රමාණය විගැහි දශ ලක්ෂ 415 ක් (රුපියල් දශ ලක්ෂ 18,134) විය. 1987 අවසානයේදී පැවති දළ විදේශීය වත්කම්වල මට්ටම 1988 සඳහා තුන් මසක පමණ අපේක්ෂිත ආනයන වියදම් පියවීමට ප්‍රමාණවත්ව පැවතින.

ලොව පුරා විනිමය අනුපාතිකයන් දැඩි විචලනයට භාජනය වූ පසුතලයක් යටතේ, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ජාත්‍යන්තර ව්‍යවහාර මුදල් බොහොමයක අගය වැඩි වන අවදියක, ශ්‍රී ලංකා රුපියලේ අගය 1987 දී ප්‍රධාන ව්‍යවහාර මුදල් බොහොමයකට සාපේක්ෂව පහත වැටුණි. ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 28 කින්ද, එක්සත් රාජධානි පවුමට සාපේක්ෂව සියයට 27 කින්ද, ඩොයිෂ් මාර්ක්වලට සාපේක්ෂව සියයට 24 කින් සහ ප්‍රංශ ප්‍රෑන්ක්වලට සාපේක්ෂව සියයට 22 කින්ද ශ්‍රී ලංකා රුපියලේ අගය පහත වැටුණි. ඉන්දියානු රුපියලට හා එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය පහත වැටීම පිළිවෙලින් සියයට 10 ක් හා සියයට 7 ක් විය. විගැහිවලට සාපේක්ෂව එක්සත් ජනපද ඩොලරයේ අගයෙහි පහත වැටීම විශාල වශයෙන් පිළිබිඹු කරමින්, විගැහිවලට අදාල ශ්‍රී ලංකා රුපියලේ අගය සියයට 20 කින් අඩු විය. ශ්‍රී ලංකාවේ වෙළෙඳ හවුල් කරුවන්ගේ ව්‍යවහාර මුදල් සමූහයක් පදනම් කරගෙන මනිනු ලබන ශ්‍රී ලංකා රුපියලේ සඵල නාමික විනිමය අනුපාතිකයෙහි අගය 1987 දී සියයට 20 කින් පහත වැටුණි. මේ අතර, සඵල මූර්ත විනිමය අනුපාතිකය එනම්, ශ්‍රී ලංකාව හා එහි වෙළෙඳ හවුල් කරුවන් අතර ඇති උද්ධමනාත්මක වෙනස්කම් හා ගලපන ලද සඵල නාමික විනිමය අනුපාතිකයෙහි අගය ද සියයට 17 කින් අඩු විය.

මෑත වර්ෂවලදී විදේශීය ණය වර්ධන වේගය වැඩිවීම සැළකිල්ල යොමු විය යුතු කරුණක් බවට 1986 සඳහා වූ වාර්ෂික වාර්තාවෙන් අවධාරණය කෙරුණි. 1986 දී රුපියල් දශ ලක්ෂ 116,429 ක්ව (විගැහි දශ ලක්ෂ 3,359) පැවති කෙටිකාලීන ණය, වෙළෙඳ ණය හා මහ බැංකුවේ ණය ගැනීම් ඇතුළු ශ්‍රී ලංකාවේ නොපියවා පැවති මුළු විදේශීය ණය ප්‍රමාණය 1987 දී රුපියල් දශ ලක්ෂ 144,531 ක් (විගැහි දශ ලක්ෂ 3,361) දක්වා වැඩි විය. ඒ අනුව, 1987 දී ශ්‍රී ලංකාවේ විදේශීය ණය, රුපියල් වශයෙන් ගත් කල, සැළකිය යුතු ප්‍රමාණයකින් (සියයට 24 කින්) ඉහළ නැඟී අතර, විගැහි අනුව ඉතා සුළු ප්‍රමාණයකින් වැඩි වී ඇත. රුපියල් වශයෙන් ගත් කල

විදේශීය ණයවල ඇති වූ තියුණු වැඩිවීම ප්‍රධාන වශයෙන්ම රුපියලෙහි අගය පහත වැටීම් නිසා සිදු වූවකි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් ලෙස නොපියවා පැවති ණය ප්‍රමාණය 1986 දී පැවති සියයට 62 සිට 1987 දී සියයට 64 දක්වා ඉහළ නැඟුණි. වර්ෂය තුළදී විශාල ලෙස ප්‍රති මිළදී ගැනීම් (ආපසු ගෙවීම්) හේතුකොටගෙන, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත වූ විදේශීය බැඳීම් 1986 දීවූ විගැහි දශ ලක්ෂ 234 සිට 1987 දී විගැහි දශ ලක්ෂ 165 දක්වා අඩු විය. මෙය පිළිවෙලින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත වූ බැඳීම්වල පහත වැටීමක් වාර්තා වූ තෙවන වසර විය.

මැදි හා දිගුකාලීන ණය සඳහා වූ ණය වාරික සහ මුළු විදේශීය ණය සඳහා වූ පොළී ගෙවීම් ඇතුළුව, විදේශීය ණය සඳහා වූ මුළු සේවා ගෙවීම් 1986 දී පැවති රුපියල් දශ ලක්ෂ 11,658 (විගැහි දශ ලක්ෂ 357) සිට 1987 දී රුපියල් දශ ලක්ෂ 14,867 (විගැහි දශ ලක්ෂ 391) දක්වා ඉහළ නැඟුණි. මීට හේතු වූයේ ණය සේවාකරණ මූර්ත වියදම් ලිහිල් කිරීමට සහාය වූ පොළී අනුපාතිකයන් අඩු වීමේ උපනතිය හා එක්සත් ජනපද ඩොලරයේ අගය අඩු වීමය. 1986 දී රුපියල් දශ ලක්ෂ 6,940 ක් (විගැහි දශ ලක්ෂ 213) වශයෙන් පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් වූ හැර ගැනීම්වල ප්‍රතිමිළදී ගැනීම් ඇතුළත් මුළු ණය වාරික ගෙවීම් 1987 දී රුපියල් දශ ලක්ෂ 9,743 ක් (විගැහි දශ ලක්ෂ 256) දක්වා සියයට 20 කින් වැඩි විය. කෙසේ වුවද, ජාත්‍යන්තර පොළී අනුපාතිකයන්ගේ ලිහිල් වීමක් හේතුකොටගෙන 1987 දී පොළී ගෙවීම් විගැහි දශ ලක්ෂ 135 දක්වා සියයට 5.8 කින් පහත වැටුණි. ණය සේවා අනුපාතය, එනම් භාණ්ඩ හා සේවා අපනයනයන්ගේ අනුපාතයක් ලෙස සැළකෙන මුළු ණය සේවා ගෙවීම්, 1986 දී වූ සියයට 26.4 සිට 1987 දී සියයට 28.5 දක්වා ඉහළ නැඟුනු අතර, එමගින් ණය වාරික ගෙවීම්වල වැඩි වීමක් පිළිබිඹු කෙරුණි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග වූ ගණුදෙනු අත් හැරීමෙන් පසු මෙම අනුපාතය 1987 දී සියයට 22 ක් වූ අතර, සමස්ත ණය සේවා අනුපාතය, එනම් නිළ සංක්‍රාමයන් රහිතව ජංගම ගිණුමෙහි වූ ලැබීම්වල අනුපාතයක් ලෙස දැක්වෙන මුළු සේවා ගෙවීම්, ඉකුත් වසරේ පැවති සියයට 22 හා සසඳන කල මෙම වසරේදී සියයට 23.8 ක් විය.

ශ්‍රී ලංකාවේ විදේශීය ගනුදෙනු අංශයෙහි නොකඩවා පවතින දුර්වලතාවය 1987 දී ගෙවුම් තුලනයේ වර්ධනයන් මගින් විදහා දැක්වෙන අතර, එමගින් සමස්ත ආර්ථික ක්‍රියාකාරිත්වය කෙරෙහිම අහිතකර බලපෑම් ඇති කල බව පෙනේ. අපනයන අංශයෙන් ගත් කල, නිෂ්පාදනය අඩුවීම හේතුකොටගෙන අපනයන පරිමාව පහත වැටීම නිසා මෙරට ප්‍රධාන ප්‍රාථමික භාණ්ඩ අපනයනයන් සඳහා ලැබුණු යහපත් මිළ ගණන් වලින් ලද පූර්ණ වාසි ශ්‍රී ලංකාවට අහිමි විය. රට තුළ පැවති නොසන්සුන්තාවය නිසා වූ අයහපත් ප්‍රචාරණය සංචාරක කර්මාන්තය කෙරෙහි 1987 දී තවදුරටත් අහිතකර ලෙස බලපෑ අතර, මෙම වසරේදී එමගින් ලද ඉපැයීම් 1980 න් පසු පැවති පහත්ම මට්ටම වාර්තා කළේය. ආනයන සම්බන්ධයෙන් සලකා බලන කල ජාත්‍යන්තර වෙළෙඳපලවල බොර තෙල් මිළ ඉහළ යාම, සමස්ත ආනයන වියදම ඉහළ මට්ටමක රැඳවීමට ඉවහල් වූ අතර, වැඩෙමින් පවතින විදේශීය ණය වගකීම් මගින් ගෙවීම් අංශය කෙරෙහි නොකඩවා අසතුටුදායක බලපෑමක් ඇති කළේය. මෙම වර්ධනයන්ගේ බලපෑම යටතේ විනිමය අනුපාතිකය නිරන්තර පීඩනයකට ලක් වූ අතර, විදේශීය වත්කම් තවදුරටත් පහත වැටෙමින් ගෙවුම් තුලන තත්ත්වය දුර්වල ස්වරූපයකින් පැවතුණි.

1987 වර්ෂයේ රාජ්‍ය මූල්‍ය කටයුතු, ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ක්‍රමයේ මෑතකාලීන අසතුටුදායක තත්වයන් තවදුරටත් පෙන්නුම් කරයි. තාවකාලික දත්තයන්ට අනුව, අයවැය හිඟය (ප්‍රදානයන් ඇතුළුව) දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් 1986 දී පැවති සියයට 10.1 සිට 1987 දී සියයට 8.3 දක්වා පහත වැටුණි. මෙය සමස්ත අයවැය තත්ත්වයෙහි දියුණු වීමක් ලෙස දිස් වුවද, අවසාන ප්‍රතිඵලය එසේ නොවීය. රජයේ ආදායමට වඩා වර්තන වියදම්වල වේගවත් වර්ධන අනුපාතිකයක බලපෑම යටතේ 1986 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.8 ක්ව පැවති වර්තන ගිණුමේ අතිරික්තය 1987 දී සියයට 1.7 දක්වා අඩු විය. ඒ සමගම

22510
21 APR 2009

ප්‍රසාරණාත්මක හිඟය එනම්, බැංකු ණය මගින් පියවිය යුතු අයවැය හිඟයේ ප්‍රමාණය, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්, සියයට 1.7 සිට සියයට 1.8 දක්වා වැඩි විය. මෙම වෙනස්වීම් තුළින් පෙනී යනුයේ රාජ්‍ය මූල්‍ය අංශයේ නොකඩවා පැවති පීඩනය, අවුරුදු ගණනාවක් තිස්සේ පැවති ආර්ථික අස්ථායිතාවයට ප්‍රධාන මූලාශ්‍රයක් වූ බවය.

### 1 . 4 සංඛ්‍යා සටහන

### රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සාරාංශ දත්ත

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | 1983 | 1984 | 1985 | 1986 | 1987 තාවකාලික |
|---|---|---|---|---|---|
| **මුළු ආදයම සහ දීමනා** .. | **26,790** | **37,354** | **39,556** | **40,991** | **46,679** |
| **මුළු ආදායම** .. | **23,317** | **34,061** | **36,249** | **37,238** | **42,155** |
| බදු ආදායම .. | 19,912 | 29,939 | 30,442 | 31,272 | 35,127 |
| බදු නොවන ආදායම .. | 3,405 | 4,122 | 5,807 | 5,966 | 7,028 |
| **දීමනා** .. | **3,473** | **3,293** | **3,307** | **3,753** | **4,524** |
| **වියදම සහ ණය ආපසු ගෙවීම්** | | | | | |
| **අඩුකළ පසු ණය දීම්** .. | **39,637** | **47,837** | **55,234** | **59,193** | **63,059** |
| වර්තන .. | 22,002 | 24,630 | 32,645 | 33,966 | 38,713 |
| ප්‍රාග්ධන .. | 15,863 | 19,915 | 21,530 | 23,236 | 22,969 |
| ණය ආපසු ගෙවීම් අඩුකළ පසු ණය දීම් | 1,772 | 3,292 | 1,059 | 1,991 | 1,377 |
| **වර්තන ගිණුම් අතිරික්තය/හිඟය (–)** .. | **1,315** | **9,431** | **3,604** | **3,272** | **3,442** |
| **අයවැය හිඟය (දීමනා වලට පෙර)** .. | **– 16,320** | **– 13,776** | **– 18,985** | **– 21,956** | **– 20,904** |
| **අයවැය හිඟය (දීමනා වලට පසු)** .. | **– 12,847** | **– 10,483** | **– 15,678** | **– 18,203** | **– 16,380** |
| **පියවීම** .. | **12,845** | **10,483** | **15,678** | **18,204** | **16,380** |
| **විදේශීය ණය ගැනීම්** .. | **6,312** | **6,492** | **7,109** | **9,061** | **5,716** |
| **දේශීය ණය ගැනීම්** .. | **6,533** | **3,991** | **8,569** | **9,143** | **10,664** |
| වෙළෙඳපොල නොවන ණය ගැනීම් .. | 1,977 | 951 | – 1,801 | – 669 | 724 |
| වෙළෙඳපොල ණය ගැනීම් .. | 4,556 | 3,040 | 10,370 | 9,812 | 9,940 |
| බැංකු නොවන .. | 4,082 | 5,135 | 5,659 | 6,765 | 6,399 |
| බැංකු .. | 474 | – 2,095 | 4,711 | 3,047 | 3,541 |
| **දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන්** | | | | | |
| **මුළු ආදයම සහ දීමනා** .. | 22·0 | **24·3** | **24·4** | 22·8 | **23·7** |
| **මුළු ආදායම** .. | **19·2** | **22·2** | **22·3** | 20·8 | **21·4** |
| බදු ආදායම .. | 16·4 | 19·5 | 18·7 | 17·4 | 17·9 |
| බදු නොවන ආදායම .. | 2·8 | 2·7 | 3·6 | 3·3 | 3·6 |
| **දීමනා** .. | **2·9** | **2·1** | **2·0** | **2·1** | 2·3 |
| **වියදම සහ ණය ආපසු ගෙවීම්** | | | | | |
| **අඩුකළ පසු ණයදීම්** .. | **32·6** | **31·1** | **34·0** | 33·0 | **32·1** |
| වර්තන .. | 18·1 | 16·0 | 20·1 | 18·9 | 19·7 |
| ප්‍රාග්ධන .. | 13·0 | 13·0 | 13·3 | 13·0 | 11·7 |
| ණය ආපසු ගෙවීම් අඩු කළ පසු ණයදීම් | 1·5 | 2·1 | 0·7 | 1·1 | 0·7 |
| **වර්තන ගිණුම් අතිරික්තය/හිඟය (–)** .. | **1·1** | **6·1** | **2·2** | **1·8** | **1·7** |
| **අයවැය හිඟය (දීමනා වලට පෙර)** .. | **– 13·4** | **– 9·0** | **– 11·7** | **– 12·2** | **– 10·6** |
| **අයවැය හිඟය (දීමනා වලට පසු)** .. | **– 10·6** | **– 6·8** | **– 9·7** | **– 10·1** | **– 8·3** |
| **පියවීම** .. | **10·6** | **6·8** | **9·7** | **10·1** | **8·3** |
| **විදේශීය ණය ගැනීම්** .. | **5·2** | **4·2** | **4·4** | **5·1** | **2·9** |
| **දේශීය ණය ගැනීම්** .. | **5·4** | **2·6** | **5·3** | **5·1** | **5·4** |
| වෙළෙඳපොල නොවන ණය ගැනීම් .. | 1·6 | 0·6 | – 1·1 | – 0·4 | 0·4 |
| වෙළෙඳපොල ණය ගැනීම් .. | 3·7 | 2·0 | 6·4 | 5·5 | 5·1 |
| බැංකු නොවන .. | 3·4 | 3·3 | 3·5 | 3·8 | 3·3 |
| බැංකු .. | 0·4 | – 1·4 | 2·9 | 1·7 | 1·8 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

1987 දී රුපියල් දශ ලක්ෂ 42,155 ක් වූ රජයේ මුළු ආදායම සියයට 13 ක වැඩි වීමක් වාර්තා කළ අතර, දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් රජයේ ආදයම 1986 දී පැවති සියයට 20.8 සිට 1987 දී සියයට 21.4 දක්වා වැඩි විය. දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් බදු ආදායමෙහිද 1986 දී වූ සියයට 17.4 සිට 1987 දී සියයට 17.9 දක්වා වැඩි දියුණු වීමක් වාර්තා කෙරුණි. මෙ මගින් ජාතික ආදායමෙහි වර්ධන අනුපාතිකය අභිබවා යන වර්ධන අනුපාතිකයක් රජයේ ආදායම් තුළින් පිළිබිඹු විය. 1987 දී බදු ආදායම මුළු ආදායමින් සියයට 83 කට දායක වූ අතර, මෙය ඉකුත් වසරෙහි පැවති අනුපාතයම විය.

වියදම් අංශය ගත් කල, රුපියල් දශ ලක්ෂ 38,713 ක් වූ මුළු වර්තන වියදමෙහි සියයට 14 ක වැඩි වීමක් වාර්තා කෙරුණි. මෙය දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස 1986 දී පැවති සියයට 18.9 සිට 1987 දී සියයට 19.7 දක්වා වැඩි වීමකි. රුපියල් දශ ලක්ෂ 17,640 ක් වූ භාණ්ඩ හා සේවා සඳහා වූ රජයේ වියදම මුළු වර්තන වියදමින් අඩකට ආසන්න විය. ඉන් සියයට 26 ක් රජයේ ණය සඳහා වූ පොළී ගෙවීම් නියෝජනය කළ අතර, සියයට 28 ක් රාජ්‍ය සංස්ථා, ආයතන හා කුටුම්භයන්ට කරන ලද වර්තන පැවරුම් විය.

1987 දී ආදායම් හා ප්‍රදානයන් වශයෙන් රැස්කර ගන්නා ලද මුළු අයවැය සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 46,679 ක් වූ අතර, මෙය සියයට 14 ක වැඩි වීමකි. අනෙක් අතට, විශාල වශයෙන්ම ප්‍රාග්ධන වියදම්වල සියයට 4 ක අඩු වීමක් හේතුකොටගෙන රුපියල් දශ ලක්ෂ 63,059 ක් වූ මුළු වියදම සියයට 7 කින් පමණක් වැඩි විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අයවැයෙහි හටගත් රුපියල් දශ ලක්ෂ 16,380 ක හිඟය (ප්‍රදානයන්ට පසුව) ඉකුත් වසරෙහි පැවති හිඟයට වඩා අඩුවීම ප්‍රශංසනීය කරුණකි. දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් ගත් කල, සමස්ත අයවැය හිඟය 1986 දී පැවති සියයට 10.1 සිට 1987 දී සියයට 8.3 දක්වා පහත වැටුණි. දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් වශයෙන් ප්‍රදානයන්ට පෙර වූ අයවැය හිඟයද කාලපරිච්ඡේද දෙක තුළදී සියයට 12.2 සිට සියයට 10.6 දක්වා අඩු විය.

අයවැය හිඟය සම්බන්ධයෙන් ඉකුත් වසරට වඩා සැළකිය යුතු දියුණුවක් දක්නට ලැබුණු නමුත්, 1987 දී හිඟය පියවීමෙහි ලා සම්පත් ලබා ගැනීමේ පසුබැසීමක් ඇති විය. විදේශීය ණය වලින් ලැබුණු සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 5,716 ක් වූ අතර, එය පසුගිය වසරේ ලැබුණු ප්‍රමාණයට වඩා සියයට 37 කින් අඩුය. ඒ අනුව, මෑත වර්ෂවලදී අයවැය හිඟයෙන් අඩකට ආසන්න ප්‍රමාණයක් පියවීමට ප්‍රමාණවත් වූ විදේශීය ණය මගින්, 1987 දී පියවීමට හැකි වූයේ හිඟයෙන් තුනෙන් එකක් පමණි. දේශීය බැංකු නොවන මූලාශ්‍රයන්ගෙන් ලැබුණු සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 6,399 ක් වූ අතර, එයද ඉකුත් වසරට වඩා සියයට 5 කින් අඩු විය. එහෙයින්, 1987 අයවැය හිඟය පියවීම සඳහා පසුගිය වර්ෂවලට වඩා විශාල සම්පත් ප්‍රමාණයක් බැංකු මූලාශ්‍රයන්ගෙන් ලබා ගැනීමට සිදු විය. බැංකු ක්‍රමයෙන් ලබා ගත් සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,541 ක් වූ අතර එය 1987 දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.8 ක් විය. 1986 දී ප්‍රසාරණාත්මක හිඟය වූයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.7 කි.

අයවැය සම්පත් සංචලනයෙහි ලා නොකඩවා ගත යුතු උත්සාහයේ අවශ්‍යතාවයත්, වැඩි ආර්ථික ස්ථායිතාවයක් පවත්වා ගැනීම අරමුණු කොට ගත් වියදම් සීමා කිරීමේ අවශ්‍යතාවයත්, 1987 සමස්ත රාජ්‍ය මූල්‍ය ක්‍රියාදාමයෙන් තවදුරටත් පෙන්නුම් කෙරේ. මුළු ආදායම් එකතු කිරීම සියයට 13 කින් වැඩි වීම නිසා ආදායම් අංශයෙන් බලන කල ප්‍රගතියක් පෙන්නුම් කළද, වර්තන වියදමෙහි ඊට මඳක් වැඩි, සියයට 14 ක ඉහළ නැඟීමක් වාර්තා විය. අයවැය කටයුතු සඳහා විදේශීය ප්‍රදානයන් මෙරටට ගලා ඒම වැඩි වූ අතර, දිගුකාලීන ණය ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් විශාල අඩු වීමක් දක්නට ලැබුණි. දේශීය වෙළෙඳපොල මූලාශ්‍රයන්ගෙන් ලබාගත හැකි සම්පත් ප්‍රමාණයෙහිද අඩු වීමක් සිදු විය. මෙම වෙනස්වීම්හි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රසාරණාත්මක හිඟය විශාල වූ අතර, එය මෑත වර්ෂවලදී මුදල් සැපයුම හා ගෙවුම් තුලනය නොකඩවා පීඩනයකට හසු කිරීමට බල පෑ ප්‍රධානතම සාධකය විය. සීමාකාරී මූල්‍ය

ප්‍රතිපත්ති යොදා ගැනීමෙන් කෙටිකාලීන වශයෙන් ප්‍රසාරණාත්මක මූල්‍ය කටයුතු වලින් ඇති වන අහිතකර ප්‍රතිඵල තරමක්දුරට සමහන් කිරීමට හැකි වුවද, දිගු කාලයේදී එබඳු දැඩි මූල්‍ය සීමාකරණයන්ගේ ප්‍රතිඵල හිතකර නොවනු ඇත. තවද, රාජ්‍ය ණය සඳහා වූ විශාල සේවා ගෙවීම් හේතුවෙන් මෙරට රාජ්‍ය මූල්‍ය ක්‍රමය කෙරෙහි අඛණ්ඩව අමතර පීඩනයක් ඇතිවිය. ලබාගත හැකි සම්පත් හා වියදම් අතර වඩාත් සතුටුදයක තුලිතතාවක් ඇති කිරීම උදෙසා රාජ්‍ය මූල්‍ය ශික්ෂණය පිළිබඳ අවශ්‍යතාව මෙම වෙනස්වීම් මගින් පෙන්නුම් කෙරේ.

දේශීය ණය ප්‍රමාණයේ තියුණු වැඩිවීම හා ආසන්න මුදල් ප්‍රසාරණයේ සීඝ්‍ර පුනර්ජීවනය සම්බන්ධයෙන් සලකා බලන කල, 1987 වර්ෂයෙහි මූල්‍ය සමස්තයන්ගේ වර්ධනයෙහි සීඝ්‍ර වැඩිවීමක් දක්නට ලැබුණි. ණයවල තියුණු වර්ධනයක් පැවතියද, කෙටිකාලීන රජයේ පිළිණපත්වල (භාණ්ඩාගාර බිල්පත්) සැළකිය යුතු ආයෝජනයන් කළ හැකි වන පරිදි වාණිජ බැංකු ක්‍රමය තවදුරටත් ද්‍රවශීලව පැවතුණි. මෙම පසුබිම තුළ සහ මහ බැංකුව විසින් සංචිත අවශ්‍යතාවයන් තවදුරටත් සැළකිය යුතු ලෙස ලිහිල් කිරීම මගින් පොළී අනුපාතිකයන් මධ්‍යස්ථ වශයෙන් වුවද පහත වැටීමට නැඹුරු විය. අධි ද්‍රවශීලතාවයන් ඉවත් කිරීම සඳහා 1985 හා 1986 වසර තුළදී මුදල් නීති පනතේ 91 වන වගන්තිය ප්‍රකාර සිය සුරැකුම්පත් නිකුත් කළ මහ බැංකුව, එම අරමුණම පෙරදැරි කරගෙන භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොල ක්‍රියාශීලී කිරීම කෙරෙහි වඩාත් බලාපොරොත්තු තැබීය. මෙම අරමුණ ඉටුකර ගැනීම පිණිස භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපලවලට පුළුල් වෙළෙඳපොල තත්ත්වයක් ලබා දීම සඳහා පියවර කිහිපයක් ගනු ලැබිණ. අඩු පිරිවැයක් යටතේ විශාල වශයෙන් ණය සැපයීම මගින් ආර්ථික කටයුතු දිරි ගැන්වීමේ අදහසින් යුතුව මූල්‍ය ප්‍රතිපත්තිය තරමක් ලිහිල් කෙරුණි. විශේෂයෙන්ම කෙටි කාලීනව වෙළෙඳපොලෙහි පොළී අනුපාතිකයන් තීරණය කිරීමේ පුළුල් ක්‍රියාදාමයක් ඇති කරලනු සඳහා වෙළෙඳපොල බලවේගයන් දිරිගන්වන ලදී. ආර්ථිකයේ නිෂ්පාදන අංශයන්හි කටයුතු නඟා සිටුවීම සඳහා වර්ෂය තුළදී මහ බැංකුව විසින් සපයන ලද ප්‍රතිමූල්‍ය පහසුකම් තවදුරටත් පුළුල් කරන ලදී.

1987 දී මුදල් සැපයුම් වර්ධනයෙහි වූ වේගවත් බව මූල්‍ය සමස්තයන් දෙකෙහිම පිළිබිඹු විය. මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් හා ඉල්ලුම් තැන්පතු වලින් සමන්විත පටු ලෙස නිර්වචනය කෙරෙන මුදල් සැපයුම ($M_1$), 1986 දී වූ සියයට 13 ක වැඩි වීමක් හා සසඳන කල, 1987 දී රුපියල් දශ ලක්ෂ 3,904 කින් හෙවත් සියයට 18 කින් වැඩි විය. මේ අතර, වාණිජ බැංකු වෙතැති මහජනයා සතු කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු (ආසන්න මුදල්) හා පටු මුදල් සැපයුමෙහි ($M_1$) එකතුවක් වශයෙන් ගැනෙන පුළුල් මුදල් සැපයුම ($M_2$) ඉකුත් වසරේදී වූ රුපියල් දශ ලක්ෂ 2,451 ක හෙවත් සියයට 5 ක වැඩි වීමක් හා සසඳන කල, මෙම වසරේදී රුපියල් දශ ලක්ෂ 7,475 කින් හෙවත් සියයට 15 කින් වැඩි විය. 1986 දී රුපියල් දශ ලක්ෂ 33 ක ඉතා සුළු වර්ධනයක් හා සසඳන කල, 1987 දී රුපියල් දශ ලක්ෂ 3,571 කින් හෙවත් සියයට 12 කින් ඉහළ නැඟ පෙරදී පැවති තත්ත්වයට යළි පත්වෙමින් ආසන්න මුදල්වල හටගත් තියුණු ප්‍රසාරණය, පුළුල් මුදල් සැපයුමෙහි වූ වැඩි වීම සම්බන්ධව බලපාන ලදී.

ඉකුත් වසරේ අත්දැකීම වූ පටු මුදල් සැපයුමෙහි ප්‍රසාරණය බෙහෙවින් මහජනයා වෙතැති ව්‍යවහාර මුදල්වලට සීමා වූ අතර 1987 දී, ඉල්ලුම් තැන්පතුවල කොටස රුපියල් දශ ලක්ෂ 1,979 කින් හෙවත් සියයට 21 කින්ද, ව්‍යවහාර මුදල්වල කොටස රුපියල් දශ ලක්ෂ 1,925 කින් හෙවත් සියයට 17 කින්ද වැඩි විය. සැළකිය යුතු කාලයක් තිස්සේ සියයට 50 ක් පමණව පැවති පටු මුදල් සැපයුමෙහි වූ තැන්පතුවල කොටස 1983 සිට පහත වැටෙමින් පැවති අතර එය 1986 අවසානය වනවිට සියයට 45 ක් දක්වා අඩු විය. ජනවාර්ගික කලබල හේතුකොට-ගෙන දිවයිනෙහි සමහර ප්‍රදේශවල සාමාන්‍ය බැංකු සේවාවන්ට සිදු වූ බාධාවන්ද ඉහත කී තත්ත්වයට හේතු විය. 1987 දී මෙම උපනතිය සියයට 46 දක්වා සුළු වශයෙන් හෝ වෙනස් වීම, සැළකිය යුතු අන්දමේ යහපත් තත්ත්වයක් ලෙස සැළකිය හැකිය.

පුස්තකාලය
මොරටුව විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
මොරටුව.

## 1 . 5 සංඛ්‍යා සටහන

### මූල්‍ය කටයුතු පිළිබඳ සංඛ්‍යා 1983 – 1987

රුපියල් දශ ලක්ෂ

| ශීර්ෂය | | 1983 | 1984 | 1985 | 1986 | 1987 |
|---|---|---|---|---|---|---|
| දේශීය ණයෙහි වෙනස | .. | 6,895 | 633 | 9,300 | 4,883 | 11,457 |
| රජයට දෙන ලද ශුද්ධ ණය වැඩිවීම | .. | 383 | –2,979 | 5,793 | 2,198 | 4,502 |
| රාජ්‍ය සංස්ථාවලට දෙනලද ණය වැඩිවීම | .. | – 292 | – 237 | 290 | 301 | 2,627 |
| සමූපකාර ආයතන වලට දෙන ලද ණය වැඩිවීම | .. | 635 | – 255 | – 263 | 120 | – 301 |
| අනෙකුත් පෞද්ගලික අංශයට දෙන ලද ණය වැඩිවීම | .. | 6,170 | 4,104 | 3,480 | 2,263 | 4,629 |
| බැංකු විදේශ වත්කම් (ශුද්ධ) වෙනස | .. | 815 | 6,777 | – 691 | – 414 | – 443 |
| මුළු වත්කම්/වගකීම් හි වෙනස | .. | 7,710 | 7,410 | 8,609 | 4,468 | 11,014 |
| පුළුල් මුදල් සැපයුම (M2) වැඩිවීම | .. | 6,747 | 6,170 | 4,982 | 2,451 | 7,475 |
| අනෙකුත් වගකීම් (ශුද්ධ) වැඩිවීම | .. | 963 | 1,240 | 3,627 | 2,018 | 3,539 |

#### මූල්‍ය කටයුතුවල වැඩිවීම් ප්‍රතිශතයක් වශයෙන්

| | | 1983 | 1984 | 1985 | 1986 | 1987 |
|---|---|---|---|---|---|---|
| මුළු දේශීය ණය වැඩිවීම ප්‍රතිශතයක් වශයෙන් | .. | 16·3 | 1·3 | 18·6 | – 8·2 | 17·9 |
| මුළු වත්කම්/වගකීම් වැඩිවීම ප්‍රතිශතයක් වශයෙන් | .. | 17·2 | 14·1 | 14·4 | 6·5 | 15·1 |
| මුළු දේශීය ණය වැඩිවීමෙන් රජයේ දයකත්වය ප්‍රතිශතයක් වශයෙන් | .. | 5·6 | –470·4 | 62·3 | 45·0 | 39·3 |
| මුළු දේශීය ණය වැඩිවීමෙන් රාජ්‍ය නොවන අංශයේ දයකත්වය ප්‍රතිශතයක් වශයෙන් | .. | 94·4 | 570·4 | 37·7 | 55·0 | 60·7 |
| වැඩිවීම ප්‍රතිශතයක් වශයෙන් | | | | | | |
| පුළුල් මුදල් සැපයුම (M2) | .. | 22·1 | 16·6 | 11·4 | 5·1 | 14·7 |
| පටු මුදල් සැපයුම (M1) | .. | 25·4 | 14·1 | 11·5 | 12·9 | 18·4 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1987 වර්ෂය තුළ මූල්‍ය වර්ධනයන්හි කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ ආසන්න මුදල් වර්ධනයෙහි වූ දැඩි පුනර්ජීවනයයි. 1986 දී රුපියල් දශ ලක්ෂ 33 ක සුළු වර්ධනයකට ප්‍රතිවිරුද්ධව 1987 දී ආසන්න මුදල් රුපියල් දශ ලක්ෂ 3,571 කින් හෙවත් සියයට 12 කින් වැඩි විය. 1985 දී ආසන්න මුදල්වල වූ වර්ධනය සියයට 11 කි. ඒ අනුව පෙනී යන්නේ, 1986 දී අසාමාන්‍ය ලෙස පහත වැටීමකින් පසුව, වඩා කැමති ආයෝජන මාර්ගයක් ලෙස බැංකු තැන්පතු කෙරෙහි නැවත යොමු වීමක් පිළිබිඹු කරමින්, ආසන්න මුදල්වල වර්ධනය එහි සාමාන්‍ය වර්ධන මාවතට 1987 දී යළි අවතීර්ණ වී ඇති බවය. ආසන්න මුදල්වල වර්ධනය ප්‍රධාන වශයෙන්ම සිදු වූයේ අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනු කරුවන් මගිනි. ඔවුන් සතු කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතුවල වැඩි වීම රුපියල් දශ ලක්ෂ 3,384 ක් හෙවත් සියයට 14 කි. මේ හා සසඳා බලන කල, රාජ්‍ය සංස්ථාවන් සතු කාලීන හා ඉතිරි කිරීමේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 119 කින්ද, සමූපකාර ආයතනයන්ගේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 69 කින්ද සුළු වශයෙන් වැඩි වී ඇත. එමෙන්ම, අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනුකරුවන් සතු ආසන්න මුදල්වල වූ වර්ධනයෙන් අඩකටත් වැඩි ප්‍රමාණයක් හට ගැනුනේ වසරේ අවසාන කාර්තුව තුළදීය. මෙම වර්ධනයට දායක වූ ප්‍රධාන සාධකයන් වූයේ අපනයන සඳහා සාපේක්ෂව ලැබුණු යහපත් මිළ ගණන් සහ වාණිජ බැංකු හා මූල්‍ය සමාගම්වල තැන්පතු අනුපාතිකයන් අතර පරතරය අඩු වීමත්ය.

ගෙවුම් තුලනයෙහි නොකඩවා පැවති දුර්වලත්වය පිළිබිඹු කරමින් විදේශීය අංශයේ කටයුතු මගින් මූල්‍ය සමස්තයන් කෙරෙහි ඇති කළ සංකෝචනාත්මක බලපෑම 1987 දී ද නොකඩවා තෙවන වසරටත් දිස්විය. බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) වර්ෂය තුළදී රුපියල්

52057

දශ ලක්ෂ 443 කින් හෙවත් සියයට 5 කින් පහත වැටුණි. 1985 සහ 1986 වර්ෂවලදී මෙම වත්කම්හි පහත වැටීම පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 691 ක් හෙවත් සියයට 7 ක් හා රුපියල් දශ ලක්ෂ 414 ක් හෙවත් සියයට 4 ක් විය. වෙළෙඳ හා ජංගම යන ගිණුම් දෙකෙහිම අඩු හිඟයක් වාර්තා කරමින් 1987 ගෙවුම් තුලන තත්ත්වය 1986 ට වඩා ප්‍රගතියක් පෙන්නුම් කළද, සමස්ත ශේෂයෙහි විගැහි දශ ලක්ෂ 72 ක හිඟයක් තවදුරටත් පැවතුණි. විදේශීය වත්කම් පහත හෙළී-මෙන් එම හිඟය පියවන ලදී. 1984 න් පසුව බැංකුවල විදේශීය වත්කම් අඛණ්ඩව සංකෝචනය වීම මගින් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය, දේශීය හා විදේශීය යන අංශ දෙකෙහිම පීඩනයන්ට ගොදුරු වී ඇති ආකාරය පිළිබිඹු කෙරෙන අතර, ශක්තිමත් ලෙස විදේශීය අංශයේ වර්ධනය නංවාලීම සඳහා ස්ථායිතාවය පවත්වා ගැනීමේ ඇති වැදගත්කම එමගින් අවධාරණය කෙරේ.

විදේශීය අංශය මුදල් සැපයුම කෙරෙහි සංකෝචනාත්මක බලපෑමක් ඇති කළ හෙයින් 1987 දී මූල්‍ය සමස්තයන් ඉහළ නැංවීමට බලපෑවේ දේශීය ණයවල තියුණු වැඩි වීමය. 1987 වසරේ දේශීය ණය ප්‍රසාරණය රුපියල් දශ ලක්ෂ 11,457 ක් හෙවත් සියයට 18 ක් විය. මෙය 1986 වසරේ වූ රුපියල් දශ ලක්ෂ 4,883 ක හෙවත් සියයට 8 ක වර්ධනයට වඩා සැළකිය යුතු ඉහළ යාමකි. 1987 දේශීය ණයවල වේගවත් වර්ධනය, රජයට දෙන ලද ශුද්ධ ණය සහ පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය යන දෙඅංශයෙහිම පිළිබිඹු විය. සමස්තයක් වශයෙන් ගත් කල, පසුගිය වසරේදී රුපියල් දශ ලක්ෂ 2,198 ක හෙවත් සියයට 11 ක වර්ධනයක් හා සැසඳීමේදී බැංකු ක්‍රමය මගින් රජයට දෙන ලද ශුද්ධ ණය 1987 දී රුපියල් දශ ලක්ෂ 4,502 කින් හෙවත් සියයට 20 කින් වැඩි විය. ඒ සමඟම, වසරකට ඉහතදී සිදු වූ රුපියල් දශ ලක්ෂ 2,684 ක හෙවත් සියයට 7 ක වඩාත් සුළු වර්ධනයක් සමඟ සසඳන කල, වාණිජ බැංකු මගින් පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය ප්‍රමාණය මෙම වසරේදී රුපියල් දශ ලක්ෂ 6,955 කින් හෙවත් සියයට 17 කින් වැඩි විය.

රජය විසින් නොකඩවා බැංකු ණය ලබා ගැනීමට යොමුවීම සැළකිල්ලට භාජන විය යුතු කරුණකි. රජයට දෙන ලද ශුද්ධ ණය වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් දේශීය ණයෙහි රජය සතු කොටස 1986 දී සියයට 35 සිට 1987 දී සියයට 36 දක්වා ඉහළ නැඟුණි. කෙසේ වුවද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත වූ වගකීම් වරින් වර ප්‍රතිඇගයීමේ ප්‍රතිඵලයක් වශයෙන්, අරමුදල වෙත වූ ශ්‍රී ලංකාවේ වගකීම් ඉටු කිරීම සඳහා මහ බැංකුව විසින් රජය වෙත සපයන ලද රුපියල් දශ ලක්ෂ 683 ක විශේෂ ණයක්ද රජය වෙත දෙන ලද ශුද්ධ ණයට ඇතුළත් විය. මේ අනුව, වර්ෂය තුළදී සෘජුවම අයවැය හේතූන් නිසා රජයට දෙන ලද ශුද්ධ ණයෙහි වූ වැඩිවීම රුපියල් දශ ලක්ෂ 3,819 තෙක් සුළු ප්‍රමාණයකින් අඩුවූ බව මෙහි ලා සඳහන් කළ යුතුය. එනමුත්, 1987 දී රජය විසින් අයවැය කටයුතු සඳහා බැංකු ණය සැළකිය යුතු ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගෙන ඇති හෙයින්, ඉදිරියට එළඹෙන වර්ෂවලදී රාජ්‍ය මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් මනා පාලනයක් ඇතිකර ගැනීමට තිර වශයෙන් අධිෂ්ඨාන කර ගැනීමේ අවශ්‍යතාවය පවතී.

1987 දී රජයට දෙන ලද ශුද්ධ ණය අධික යැයි සැළකිය හැකි වුවද, එහි බලපෑම අඩු කෙරෙන සාධකයක් වූයේ රජයට දෙන ලද ශුද්ධ ණයෙහි පුළුල් වීම සඳහා ප්‍රධාන වශයෙන්ම භාණ්ඩාගාර බිල්පත්වල සිය ආයෝජනයන් වැඩිකිරීම මගින් වාණිජ බැංකු වැඩි වශයෙන් දායක වීමය. වර්ෂය තුළදී වාණිජ බැංකු විසින් රජයට දෙන ලද ශුද්ධ ණය රුපියල් දශ ලක්ෂ 3,035 කින් වැඩි විය. මෙය හා සසඳා බලන කල, 1987 දී මහ බැංකුව විසින් රජයට දෙන ලද ශුද්ධ ණයවල වැඩිවීම රුපියල් දශ ලක්ෂ 1,468 ක් වූ අතර, එයට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා සම්බන්ධ ගණුදෙනු සඳහා දෙන ලද රුපියල් දශ ලක්ෂ 683 ක විශේෂ ණයක්ද ඇතුළත් විය. විශේෂයෙන්ම 1987 අගෝස්තු මාසයේදී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයන් අඩු කිරීම නිසා ද්‍රවශීලතා තත්ත්වය වැඩි දියුණු වූ හෙයින්, වාණිජ බැංකුවලට විශාල සම්පත් ප්‍රමාණයක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කළ හැකි විය.

52057

සංවර්ධනාත්මක පැත්තකින් සළකා බලන කල, 1987 දී ණය හා සම්බන්ධ වර්ධනයන්හි විශේෂ ලක්ෂණයක් වූයේ පෞද්ගලික අංශයෙන් ණය සඳහා වූ ඉල්ලුම යලි සීඝ්‍රයෙන් වැඩි වීමය. රාජ්‍ය සංස්ථා, සමූපකාර ආයතන සහ අනෙකුත් පෞද්ගලික අංශය සමන්විත සමස්ත පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය සම්බන්ධයෙන් 1986 දී ඇතිවූ රුපියල් දශ ලක්ෂ 2,684 ක නැතහොත් සියයට 7 ක වැඩිවීම හා සසඳා බලන කල, 1987 දී එම ණය රුපියල් දශ ලක්ෂ 6,955 කින් නැතහොත් සියයට 17 කින් වැඩි විය. සමස්ත පෞද්ගලික අංශයට දෙන ලද දළ ණයවල වැඩි වීමෙන් අති විශාල කොටසක් අනෙකුත් පෞද්ගලික අංශය සඳහා විය. 1986 දී රුපියල් දශ ලක්ෂ 2,263 ක නැතහොත් සියයට 7 ක වැඩිවීම හා සැසඳීමේදී, අනෙකුත් පෞද්ගලික අංශය සඳහා වාණිජ බැංකු විසින් දෙන ලද ණය 1987 දී රුපියල් දශ ලක්ෂ 4,629 කින් නැතහොත් සියයට 13 කින් ඉහළ නැගුණි. වර්ෂය තුළදී සමස්ත පෞද්ගලික අංශයට දෙන ලද දළ ණයවල වැඩි වීමෙන් ආසන්න වශයෙන් තුනෙන් දෙකොටසක් පමණ අයත් වූයේ මෙම අංශයටය. විශේෂයෙන්ම ශ්‍රී ලංකා රුපියලෙහි අගය හීන වූ පසුබිමක, ආනයන හා ඒ හා සම්බන්ධ වෙළෙඳ කටයුතු සඳහා ණය වැඩියෙන් ප්‍රයෝජනයට ගැනීම ද, සාපේක්ෂ වශයෙන් යහපත් වූ මිළ ගණන් ආශ්‍රිතව අපනයන ණය සඳහා වූ ඉල්ලුම වැඩිවීම ද යන කරුණු හේතුවෙන් වර්ෂය තුළදී අනෙකුත් පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණය ඉහළ මට්ටමක පැවතුණි.

1985 දී රුපියල් දශ ලක්ෂ 290 ක නැතහොත් සියයට 7 ක හා 1986 දී රුපියල් දශ ලක්ෂ 301 ක නැතහොත් සියයට 7 ක සුළු වැඩිවීම් හා සසඳා බලන කල, 1987 දී රාජ්‍ය සංස්ථාවලට වාණිජ බැංකු විසින් දෙන ලද ණය රුපියල් දශ ලක්ෂ 2,627 කින් නැතහොත් සියයට 55 කින් සැළකිය යුතු පරිදි වැඩි විය. පසුගිය වර්ෂයේ සැළකිය යුතු බැංකු ණය ප්‍රමාණයක් ලබාගත් වැවිලි සංස්ථා දෙක වන ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලය විසින් 1987 දී ද යලි විශාල වශයෙන් බැංකු ණය ලබාගන්නා ලදී. කෙසේ වුවද, 1987 දී ණය ලබා ගන්නා ලද්දේ ද්‍රවශීලතා ගැටළුවලින් මිදීමට වඩා රජය සතු වැවිලි සංවර්ධනය සඳහා වූ මැදි කාලීන ආයෝජන වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වශයෙනි. බොරතෙල් මිළ ගණන් ඉහළ යාම සහ නඩත්තු කටයුතු සඳහා පිරිපහදුව වසා තබන කාලය තුළදී ඉල්ලුම සපුරාලීම පිණිස අවශ්‍ය වන නිමි ද්‍රව්‍යවල තොග රැස් කිරීමේ අවශ්‍යතාවය නිසා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් වැඩියෙන් ණය ප්‍රයෝජනයට ගන්නා ලදී. 1987 දී වැඩි වශයෙන් බැංකු ණය ලබාගත් තවත් සංස්ථාවක් වූයේ සමූපකාර තොග වෙළෙඳ සංස්ථාවය. මෙය අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය තොග වශයෙන් ආනයනය කිරීම සඳහා විය. කෙසේ වුවද, වර්ෂය තුළදී සංස්ථා කිහිපයක් බැංකු ණය මත රඳා පැවැත්ම අඩුකර ඇත. මේවා අතර ලංකා වානේ සංස්ථාව, ලංකා තුනී ලෑලි සංයුක්ත මණ්ඩලය, ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව හා වේයන්ගොඩ ජේෂ කර්ම සංස්ථාව යන සංස්ථාවන් විය.

1986 දී රුපියල් දශ ලක්ෂ 120 කින් නැතහොත් සියයට 9 කින් වැඩිවූ සමූපකාර ආයතන සඳහා දෙන ලද බැංකු ණය, 1987 දී රුපියල් දශ ලක්ෂ 301 කින් නැතහොත් සියයට 21 කින් සැළකිය යුතු පරිදි පහත වැටුණි. මේ සඳහා දායක වූ ප්‍රධාන සාධකය වූයේ නියං තත්ත්ව-යෙන් හානි පැමිණි ප්‍රදේශවල වගා කටයුතු සඳහා මෙන්ම කෘෂි නිෂ්පාදන අලෙවිය සඳහා වූ ණයදීම් අඩු වීමය.

සමහර අත්තිකාරම් හා තැන්පතු සඳහා වූ පොළී අනුපාතිකවල දක්නට ලැබුණු පහත වැටීමත් සමඟ, සුළු වශයෙන් වුවද පසුගිය වසරේ ආරම්භ වූ පොළී අනුපාතිකයන්ගේ අනුක්‍රමික පහත වැටීම 1987 තුළදීද දක්නට ලැබුණි. විශේෂයෙන්ම වර්ෂයේ ප්‍රථම භාගයේදී මූල්‍ය ක්‍රමයේ දක්නට ලැබුණු අතිරික්ත ද්‍රවශීලතාවය මෙම පහත වැටීමට තරමක් දුරට ඉවහල් විය. සුළු තැන්පතු සංචලනය කිරීමේ මූලික ආයතනය වූ ජාතික ඉතිරි කිරීමේ බැංකුව සිය ස්ථාවර තැන්පතු පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 13 ක් ලෙස වර්ෂය මුළුල්ලේම ස්ථාවරව පවත්වාගෙන නොගියේ නම් මෙම අඩුවීම සමහරවිට මීට වඩා කැපී පෙනීමට ඉඩ තිබුණි.

කාලීන තැන්පතු සහ තැන්පතු සහතික සඳහා මූල්‍ය සමාගම් තරඟකාරී පොළී ප්‍රමාණයක් ගෙවීම තවදුරටත් කරගෙන යන ලදී. නිදසුනක් වශයෙන්, වර්ෂයේ අවසාන කාර්තුව තුළදී වාණිජ බැංකු විසින් ගෙවන ලද වර්ෂයකට සියයට 8.5 සිට 14 දක්වා වූ පොළී අනුපාතිකයන් හා සසඳන කල, සමහර ප්‍රධාන පෙළේ මූල්‍ය සමාගම් එක් වර්ෂයක තැන්පතු සඳහා සියයට 16 සිට 20 දක්වා වූ පොළී අනුපාතිකයන් ගෙවන ලදී. කෙසේ වුවද, 1987 දෙසැම්බර් සිට මූල්‍ය සමාගම්වල තැන්පතු අනුපාතිකයන්, මූල්‍ය සමාගම් පාලනය කිරීමේ පණත යටතේ මහ බැංකුව විසින් නිකුත් කරන ලද මග පෙන්වීම් යටතේ යම් සීමාවන්ට යටත් කරන ලදී.

විමර්ශනයට භාජනය වූ වර්ෂය තුළදී කෙටිකාලීන මුදල් වෙළෙඳපොලේ අනුපාතිකයන් තවදුරටත් පහළ බැසීමේ ප්‍රවණතාවයක් දැක්වීය. භාණ්ඩාගාර බිල්පත් සඳහා වන ප්‍රාථමික වෙළෙඳපොලේ අනුපාතික තීරණය වීමේදී වෙළෙඳපොල බලවේගයන් විශේෂයෙන් බලපාන ලදී. ආයෝජකයන් ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලට ඇද ගැනීමේ අරමුණින් යුතුව ද්විතීය භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලේ වට්ටම් අනුපාතිකය (එලදාව) සැළකිය යුතු ලෙස අඩු කරන ලදී. වර්ෂයේ ප්‍රථම මාස 8 තුළදී ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොලේ අනුපාතික වර්ෂයකට සියයට 8 සිට 12 අතර වෙනස් විය. කෙසේ වුවද, එතැන් සිට සමස්ත පොළී අනුපාතික ව්‍යුහයේ පහත වැටීමේ ප්‍රවනතාවයට අනුකූලව අනුපාතිකයන් සියයට 8 සිට 11 දක්වා පටු සීමාවක් තුළ විචලනය විය.

1987 දී වෙළෙඳපොල තත්ත්වයන් නිරූපනය වන පරිදි පොළී අනුපාතික පහත හෙළීම සඳහා වාණිජ බැංකු ක්‍රමය වඩාත් සුදුසු තත්ත්වයක පසු විය. ප්‍රථමයෙන්ම, රාජ්‍ය බැංකු දෙක විසින් විවිධ වර්ගයේ තැන්පතු සඳහා ගෙවන ලද සිය පොළී අනුපාතිකයන් පහත හෙළන ලදී. සමහරවිට, පොළී අනුපාතිකයන් අඩු කිරීම සඳහා වාණිජ බැංකුවලට කළ විශාලතම පෙළඹවීම ඇති වූයේ මහ බැංකුවේ සමහර ප්‍රතිපත්තිමය වෙනස්කම් වලිනි. පළමුව, බැංකු අනුපාතිකය 1987 අගෝස්තුවලදී වර්ෂයකට සියයට 10 දක්වා එක් ප්‍රතිශතයකින් අඩු කරන ලදී. දෙවනුව, එම මාසය තුළදීම ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයන් සැළකිය යුතු ආන්තිකයකින් අඩු කරනු ලැබීම නිසා තැන්පතු වගකීම් සඳහා වූ සාමාන්‍ය සංචිත අනුපාතය සියයට 12.3 සිට සියයට 10.0 දක්වා අඩු විය.

වාණිජ බැංකුවල අරමුදල් පිරිවැය අඩු වීමට බල පෑවේ යැයි සිතිය හැකි ඉහත සඳහන් ක්‍රියා මාර්ග ක්‍රියාත්මක කිරීමත් සමග වාණිජ බැංකු විසින් සිය ණය සඳහා වූ පොළිය සැළකිය යුතු ලෙස අඩු කරතියි අපේක්ෂා කෙරුණි. එහෙත්, ප්‍රායෝගික වශයෙන් එය එසේ සිදු නොවූ අතර වාණිජ බැංකු ණය සඳහා අය කරන ලද පොළී අනුපාතයන් පහත වැටුනේ ඉතා සුළු වශයෙනි. නිදසුනක් වශයෙන්, 1985 අවසානයේ සියයට 20.1 සිට 1986 අවසානයේ සියයට 19.0 දක්වා පහත වැටුණු වාණිජ බැංකුවල බර තබන ලද සාමාන්‍ය ණය දීමේ පොළී අනුපාතිකය 1987 සැප්තැම්බර් අවසානයේදී අඩු වූයේ සියයට 18.4 ක් දක්වා පමණි. මේ අතර, දිගුකාලීන ණය දෙන ආයතනයන්හි ණය දීමේ පොළී අනුපාතිකයන් 1987 වර්ෂයේදී බොහෝදුරට නොවෙනස්ව පැවතුණි.

පසුගිය වර්ෂයේ වාර්ෂික වාර්තාවේ සඳහන් කරන ලද පරිදි, වාණිජ බැංකුවල පොළී අනුපාතිකයන් පහත හෙළීමට ඇති මැලිකම පිළිබඳ ගැටළුව සැළකිල්ල යොමු විය යුතු කරුණකි. ප්‍රතිපත්තිමය වෙනස්කම් හා වෙළෙඳපොල වෙනස්වීම් වලට අනුකූලව පොළී අනුපාතිකයන් ප්‍රමාණවත් පරිදි පහත හෙළීමට අපොහොසත් වීම තුළින්, එක්තරා දුරකට පුළුල් ශාඛා පද්ධතියක් සහ ආරක්ෂක කටයුතු හා සම්බන්ධ අධික වියදම් ඇතුළු ඉහළ පරිපාලන පිරිවැයකින් හෙබි, රාජ්‍ය අංශයේ බැංකුවල වැඩි බලපෑමක් සහිත ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු ව්‍යුහයේ පවතින කතිපයාධිකාරී ස්වරූපය පිළිබිඹු කිරීමක් බව කිව හැක. මෙම බැංකු සිය ව්‍යාපාරික කටයුතු

කිසියම් ක්‍රමානුකූල පදනමක් මත සකස් කිරීමේ ක්‍රියාමාර්ගවල යෙදී සිටින අතර, පොළී අනුපාතික තීරණය කිරීමේ ලා වෙළෙඳපොල බලවේගයන් විසින් වඩා වැදගත් කාර්යභාරයක් ඉටු කිරීමට නම්, මෙම ක්‍රියා මාර්ග වඩාත් ශක්තිමත් කළ යුතුව ඇත.

ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයන් අඩු කිරීම හා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිමූල්‍යකරණ පහසුකම් තවදුරටත් වැඩි කිරීම තුළින් පැහැදිළි වන පරිදි, 1987 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිපත්තියේ කිසියම් නම්‍ය ස්වරූපයක් දක්නට ලැබුණි. වර්ෂයේ ප්‍රථම භාගය තුළදී මිළ සංචලනයන් හා සම්බන්ධව සාපේක්ෂ වශයෙන් පැවති ස්ථාවර තත්ත්වයන් හා සලකා බලන කල, ආර්ථික කටයුතු දිරිගැන්වීම සඳහා මූල්‍ය ප්‍රතිපත්තිය තරමක් ලිහිල් කිරීම යෝග්‍ය බව සලකන ලදී.

1984 අවසාන භාගයේදී හඳුන්වා දෙන ලද ''ශ්‍රේණි ක්‍රමය'' මත පදනම් වූ විශේෂ සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාවය ඉවත් කිරීමත් සමඟ වාණිජ බැංකුවල සංචිත මගින් ඇතිවන පීඩනය ලිහිල් කිරීමේ ක්‍රියාවලිය 1986 මුල් භාගයේදී ආරම්භ විය.* ඊලඟ අදියර වූයේ 1983 දෙසැම්බර් මස සිට බලපවත්වන ලද ප්‍රයෝජනයට නොගත් අයිරා ශේෂයන් මත පවත්වා ගත යුතුව තිබූ සංචිත අවශ්‍යතාවය 1987 ජූනි මසදී ඉවත් කිරීමයි. අවසාන ලිහිල් කිරීම වූයේ 1987 අගෝස්තු මස කරන ලද ප්‍රධාන සංශෝධනයයි. මෙහිදී සියයට 10 සිට සියයට 18 දක්වා වෙනස් වූ විවිධ ගණයේ තැන්පතු මත වූ සංචිත අවශ්‍යතාවයන් සියයට 10 ක් වශයෙන් ඒකීය කරන ලද අතර, එය සියළුම වර්ගවල වාණිජ බැංකු තැන්පතු වගකීම් සඳහා අදාළ කරන ලදී. මෙම සංශෝධනය අනුව, තැන්පතු වගකීම් සඳහා වූ සාමාන්‍ය සංචිත අනුපාතය සියයට 12.3 සිට සියයට 10.0 දක්වා අඩු වූ අතර, එමගින් සංචිත පවත්වා ගෙන යෑමේ පිරිවැය අඩු කෙරුණි.

ආර්ථිකයේ පූර්වතා අංශවලට දෙන ලද කෙටි හා මැදි කාලීන ණය පහසුකම් තවදුරටත් නංවාලීමේ අරමුණින් යුතුව මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට හා වෙනත් සමහර මූල්‍ය ආයතනවලට ප්‍රතිමූල්‍ය පහසුකම් නොකඩවා සලසන ලදී. විවිධ යෝජනා ක්‍රම යටතේ බැංකුව විසින් සපයා ඇති මුළු නොපියවන ලද ප්‍රතිමූල්‍ය ණය ප්‍රමාණය 1987 දී රුපියල් දශ ලක්ෂ 344 කින් වැඩි වී වර්ෂය අවසානයේ දී රුපියල් දශ ලක්ෂ 3,496 ක් විය. මැදි හා දිගු කාලීන ආයෝජන නංවාලීම සඳහා වර්ෂය තුළදී බැංකුවේ සාමාන්‍ය සම්පත් වලින් මැදි හා දිගුකාලීන ණය අරමුදලට රුපියල් දශ ලක්ෂ 250 ක් පවරන ලද අතර, මෙ මගින් අරමුදලේ ප්‍රතිමූල්‍යකරණ හැකියාව රුපියල් දශ ලක්ෂ 1,275 ක් දක්වා වැඩි කෙරුණි.

ඉහත සඳහන් කරන ලද පරිදි, 1987 ජනවාරි මස සිට ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වල ඵලදාව තීරණය කිරීමෙහි ලා, වෙළෙඳපොල බලවේග මගින් විශාල කාර්යභාරයක් ඉටු කෙරුණි. ඒ සමඟම, වාණිජ බැංකු සහ අනිකුත් සහභාගිවන්නන් වැඩියෙන් ප්‍රාථමික වෙළෙඳ කටයුතුවල යෙදීමට පෙළඹවීම නිසා මහ බැංකුව විසින් අළෙවි කරන ලද ද්විතීය භාණ්ඩාගාර බිල්පත්වල පලදාව පහත හෙලන ලදී. තවද, සතිපතා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මගින් බැංකුවල ද්‍රවශීල අරමුදල් ආයෝජනය කිරීම සඳහා නිරතුරුව කෙටිකාලීන පත්‍රිකා සම්පාදනයක් සහතික කිරීමට උපකාරී විය. මේ අතර, මහ බැංකු සුරැකුම්පත්වල කූපන් අනුපාතිකය අඩු කිරීම සහ පරිණත කාලය මාස හය සිට වර්ෂය දක්වා දීර්ඝ කිරීමත් නිසා මුදල් ආයෝජනය සඳහා ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වඩාත් ආකර්ශණීය විය. මේ අනුව, මහ බැංකු නොවන මූලාශ්‍රයන්ගේ භාණ්ඩාගාර බිල්පත් දැරීම 1986 අවසානයේ රුපියල් දශ ලක්ෂ 4,059 සිට 1987 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 7,562 දක්වා වැඩි විය. මෙය නොපියවා ඇති මුළු භාණ්ඩාගාර බිල්පත් වලින් සියයට 25 කි.

ජාතික ණය සැලැස්ම යටතේ ඒ ඒ අංශ සඳහා ණය වෙන් කිරීම මගින් ණය යොමු කෙරෙන දිශාව කෙරෙහි මහ බැංකුව විසින් තවදුරටත් බලපෑම් කරන ලදී. මෙම ණය සැලැස්ම මගින් වාණිජ බැංකු, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ දිගුකාලීන ණයදීමේ ආයතන විසින් පෞද්ගලික

* ශ්‍රේණි මත වූ සංචිත ක්‍රමය පිළිබඳ විස්තර 1984 වාර්ෂික වාර්තාවේ II වන කොටසේ පිටු අංක V හි දක්වා ඇත.

අංශයට ණය සැපයීම ආවරණය කරන ලදී. 1987 සඳහා වූ ණය සැලැස්මට අනුව, පෞද්ගලික අංශයට (එනම්, රාජ්‍ය සංස්ථා, සමුපකාර ආයතන සහ අනෙකුත් පෞද්ගලික අංශයේ සංයුක්ත කොටස්වලට) වාණිජ බැංකු ණය දීම සියයට 13 කින් වැඩි වෙතැයි අපේක්ෂා කෙරිණි. එහෙත්, පෞද්ගලික අංශයට ණය දීමේ වර්ධන ඉලක්කය රුපියල් දශ ලක්ෂ 2,236 කින් හෙවත් සියයට 41 කින් ඉක්මවන ලදී. විශේෂයෙන්ම, මැදි කාලීන ආයෝජන වැඩපිළිවෙල යටතේ රාජ්‍ය අංශයට අයත් වැවිලි සංවර්ධනය සඳහා වූ කෘෂිකාර්මික අරමුණු මත ණය ප්‍රයෝජනයට ගැනීම ඉහළ මට්ටමක පැවතීම මේ සඳහා විශාල බලපෑමක් ඇති කරනු ලැබීය. ආයතනයන්ගේ වර්ධනය මෙන්ම මූලිකත්වය දිය යුතු අවශ්‍යතාවයන්ගේ වැඩි වීමත් නිසා ආංශික වශයෙන් වන ණය අවශ්‍යතා නිවැරදි ලෙස පුරෝකථනය කිරීම සමහර අවස්ථාවලදී අපහසු වේ.

ආර්ථිකයේ අතිරික්ත ද්‍රවශීලතාවයක් පැවතුණද, ප්‍රාග්ධන වෙළෙඳපොල මධ්‍යස්ථ පරිමාණයකින් තවදුරටත් ක්‍රියාත්මක විය. වර්ෂය තුළදී නිකුත් කරන ලද නව කොටස් ප්‍රමාණය පසුගිය වර්ෂයේ මෙන් සියයට 5 ක් පමණක් විය. කෙසේ වුවද, පසුගිය වසරේ වූ රුපියල් දශ ලක්ෂ 130 ක් හා සසඳන කල, මෙම වර්ෂය තුළදී ඉදිරිපත් කරන ලද කොටස්වල අගය රුපියල් දශ ලක්ෂ 206 ක් විය. විශේෂ බදු වරප්‍රසාද රහිතව සීමාසහිත සම්පත් බැංකුව විසින් කරන ලද රුපියල් දශ ලක්ෂ 174 ක් වටිනා කොටස් නිකුතු දෙක 1987 වර්ෂයේ ප්‍රාථමික කොටස් වෙළෙඳපොලෙහි වැඩි බලපෑමක් ඇති කළේය. තවදුරටත් වෙළෙඳපොල සංවර්ධනය කිරීමේ ක්‍රියා මාර්ගයක් වශයෙන් 1987 දී රජය විසින් සුරැකුම්පත් සභා පණත නීතිගත කරන ලදී. නව සුරැකුම් පත් සභාව මගින් සුපරීක්ෂණය කළයුතු ක්‍රමවත් කොටස් වෙළෙඳපොලක් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය නීතිමය රාමුව මෙ මගින් සම්පාදනය කෙරුණි.

කලින් සඳහන් කළ පරිදි, 1987 දී ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වය කෙරෙහි සාධක කීපයක් බලපෑ අතර ඉන් සමහරක් පැහැදිලි ලෙසම එහි පාලනයෙන් තොර ඒවා විය. කෘෂිකාර්මික අංශය තුළ අහිතකර කාලගුණ තත්ත්වයන් හා අඛණ්ඩව පැවති ජනවාර්ගික කලබල යන කරුණු දෙකම නිෂ්පාදනය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය. සංචාරක ව්‍යාපාරයට හා ධීවර කර්මාන්තයටද ජනවාර්ගික කලබල මගින් බාධා ඇති විය. ජලාශ පිහිටි ප්‍රදේශවල දිගුකලක් පැවති නියං තත්ත්වය නිසා ජල විදුලිබල උත්පාදනයට බාධා ඇති වූ අතර, විදුලි බලය කපා හැරීම කාර්මික නිෂ්පාදනය කෙරෙහි අහිතකර අන්දමින් බලපෑවේය. 1977 ආර්ථික ප්‍රතිසංස්කරණයන්ගෙන් පසු දශකය තුළ සිදුවූ සිත් ගන්නා සුළු වර්ධනයෙන් අනතුරුව, ඉහත කී කරුණුවල බලපෑම නිසා මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතිකය සියයට 1.5 දක්වා පහත වැටුණි. ඇත්ත වශයෙන්ම, ජනගහන වර්ධනය සඳහා ගැලපීම් කළ විට, ඒක ජන මූර්ත දළ දේශීය නිෂ්පාදිතය පහත වැටීම වළක්වාලීමට, මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සමත් වූයේ ඉතාමත් සුළු වශයෙනි. 1971 කලබල වලින් අහිතකර ලෙස බලපෑ වර්ධනයෙන් පසුව හට ගත් අඩුම වර්ධන තත්ත්වය 1987 දී වූ ආර්ථික වර්ධනය විය. ආර්ථික සංවර්ධනය අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා ස්ථාවර හා සාමකාමී තත්ත්වයන්හි අවශ්‍යතාවය මෙයින් අවධාරණය කෙරේ.

වෙළෙඳ හා ජංගම ගිණුම යන දෙකෙහිම අඩු වූ හිඟයන් මගින් ගෙවුම් තුලනයෙහි යම් දියුණුවක් දක්නට ලැබුණ ද, බාහිර ස්ථාවරත්වය සම්බන්ධයෙන් සැළකිල්ල යොමුවීමට තරම් විශාල තත්ත්වයක සමස්ත හිඟය පැවතුණි. 1987 දී විදේශීය අංශයේ ප්‍රධාන ගැටළුව වූයේ අහිතකර කාලගුණික බලපෑම්වලට හසුවීම නිසා කෘෂිකාර්මික නිෂ්පාදනය අඩු වීමෙන්, මිළ ඉහළ යාම මගින් ඇති වූ මුළු වාසිය ලබාගැනීමට නොහැකි වීමය. වාරිමාර්ග සහ ජල විදුලි බලය සඳහා විශාල ආයෝජනයන් කරනු ලැබුවද, ශ්‍රී ලංකාව තවදුරටත් කාලගුණික විපර්යාසයනට බොහෝ සෙයින් ගොදුරු වේ. තෙල් මිළ ගණන් නැවත ඉහළ නැඟීම සහ ණය සේවා ගෙවීම් ඉහළ යාමත් සමග විදේශීය අංශයද තවදුරටත් බලපෑම්වලට ලක් විය. අහිතකර වාතාවරණයක් තුළ ප්‍රමාණවත් වර්ධන අනුපාතිකයක් පවත්වා ගෙන යාම සඳහා උත්සාහ දරන පටු පදනමක් සහිත, ප්‍රාථමික වෙළෙඳ භාණ්ඩ මත රඳා පවතින ආර්ථිකයක පවත්නා කටුක යථාර්ථය මෙම

වර්ධනයන් මගින් පිළිබිඹු වේ. ඒ අනුව, 1988 දී හා ඉන් ඉදිරියට ශ්‍රී ලංකා ආර්ථිකයට දැඩි අභියෝගයන්ට මුහුණ පෑමට සිදුවනු ඇත. ස්වාභාවික සම්පත්වල හිඟකම සහ කෘෂිකාර්මික අංශයේ සීමාවන් අනුව ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය අත්‍යාවශ්‍යයෙන්ම දැනට වඩා බෙහෙවින් විවිධාංගීකරණය කළ යුතුව ඇත. නමුත්, එසේ කිරීමේදී පටු අපනයන පදනමක් මත සහ අඩු ඵලදාවකින් යුතු විශාල රාජ්‍ය අංශයක් මත රඳා පවතින ආර්ථිකයක සිට වඩා ශක්තිමත් මෙන්ම වඩා සමතුලිත ආර්ථිකයක් අරමුණු කරගත්, සංවර්ධන උපාය මාර්ගයක පුළුල් පදනම වශයෙන් අපනයනයට නැඹුරුවූත්, ඵලදායි මාර්ගයන්හි ආයෝජනයන් සහිතවූත් ආර්ථිකයකට ක්‍රමෙන් පරිවර්තනය විය යුතුය.

රාජ්‍ය මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් සලකා බලන කල, සමස්ත අයවැය හිඟය අඩුවීමෙන් එක්තරා වැඩි දියුණු වීමක් පෙනී ගියද, අඩු වූ ප්‍රාග්ධන ලැබීම් නිසා 1987 දීද ප්‍රසාරණාත්මක මූල්‍යකරණය තවදුරටත් පවත්වා ගෙන යාමෙන් මුල් බැසගත් ව්‍යුහාත්මක ගැටළුවක් පැන නැඟී ඇත. නිෂ්පාදනය පසු බැසීම හා සමහර ආහාර ද්‍රව්‍යවල සැපයුම අඩු වීමත්, මුදල් සැපයුම වැඩිවීම වේගවත් වීමත් යන කරුණු දෙකම නිසා 1987 අවසන් මාස කිහිපය තුළ මිළ ගණන් තියුණු ලෙස ඉහළ නැඟුණි. උද්ධමනාත්මක පීඩනයන් යළි නැඟී සිටීමේ ප්‍රවනතාවය දැඩි අධිෂ්ඨානයකින් යුතුව යටපත් කළ යුතුව ඇත. මෙය ඉටු කර ගැනීමට අපොහොසත් වුවහොත් ආර්ථිකය කෙරෙහි ඇති විශ්වාසය පළුදු වීමට හේතු වනු ඇත. ආයෝජනයන් සහ නිෂ්පාදනය සඳහා වූ දිරි ගැන්වීම් වලට හානි නොවීමට නම්, උද්ධමනය පාලනය කිරීමෙහිදී මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ඇති නිදහස සීමා සහිත බව වටහා ගත යුතුය. ඇත්ත-වශයෙන්ම, අනාගතයේදී මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී එකිනෙකට ගැටෙන කරුණු අතර සියුම් සමතුලිතතාවක් පවත්වා ගැනීම අවශ්‍ය වේ. මිළ ස්ථාවරත්වය පවත්වා ගැනීම සඳහා මූල්‍ය ප්‍රතිපත්තිය මගින් ප්‍රමාණවත් ආධාරයක් සැලසිය හැකි නමුත් එහිදී ආයෝජනයට සහ වර්ධනයට අහිතකර බලපෑම් ඇති වන අන්දමේ දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමෙන් වැළකිය යුතුය.

අඛණ්ඩ ආර්ථික වර්ධනය සඳහා අත්‍යවශ්‍ය තත්ත්වයක් වන සාර්ව ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගෙන යාමේ පූර්ව කොන්දේසියක් ලෙස සැලකෙන රාජ්‍ය මූල්‍ය කටයුතු මනාව පාලනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව 1986 වාර්ෂික වාර්තාවෙහි අවධානය යොමු කර ඇත. මේ අනුව, 1987 දී රාජ්‍ය මූල්‍ය අංශයේ වර්ධනයන් එතරම් යහපත් නොවන අතර අසමතුලිතතා කිහිපයක් නොකඩවා ආර්ථික තත්ත්වය කෙරෙහි අහිතකරව බලපාන හෙයින් රාජ්‍ය මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් දැඩි ශික්ෂණයක් පවත්වා ගැනීමට තවදුරටත් අධිෂ්ඨාන කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කළ යුතුව ඇත. දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් රජයේ ආදායම සියයට 20 ක පමණ ප්‍රමාණයක පවත්වා ගෙන යාමට හැකි වුවද, බොහෝ දුරට වැඩි වන වර්තන වියදම් නිසා සමස්ත හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් සියයට 11 ක් පමණ විය. මෙම පසුබිම යටතේ ආර්ථිකයෙහි පවත්නා ව්‍යුහාත්මක දුර්වලකම් අඩු කිරීම සඳහා අවශ්‍ය අයවැය හා ගෙවුම් තුලන උපාය මාර්ගයක පුළුල් වැඩ පිළිවෙලක් 1987 අයවැය කථාව සමඟ හඳුන්වා දෙන ලද මැදි කාලීන ප්‍රතිපත්ති රාමුව තුළ ගැබ් විය. 1987 සිට 1989 දක්වා වූ තුන් වසරක කාලය සඳහා වන ප්‍රතිපත්ති රාමුව මගින් මූලික වශයෙන් ඉලක්ක කර ගෙන ඇත්තේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහතික කිරීම සහ එමගින් අනාගත වර්ධනය හා ස්වයංශක්තිය සඳහා ඇති හැකියාවන් වැඩි දියුණු කිරීමය. අයවැය හිඟය සහ ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ හිඟය සඳහා නිශ්චිත ඉලක්ක තීරණය කර ඇත. මෙම ඉලක්ක අනුව, අයවැය හිඟය (ප්‍රදානයන්ට පෙර) දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් 1987 දී සියයට 11 සිට 1989 දී සියයට 9 දක්වා අඩු කිරීමටත්, ගෙවුම් තුලනයේ ජංගම ගිණුමෙහි හිඟය, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 1987 දී සියයට 7 සිට 1989 දී සියයට 5 දක්වා පහත හෙලීමටත් අපේක්ෂා කෙරේ. මෙම අඩු වූ හිඟය ඉතා සහනදායක කොන්දේසි යටතේ ලබා ගන්නා විදේශ සම්පත් මගින් පියවා ගත හැකි වේයැයි අදහස් කෙරේ.

කෙසේ වුවද, අනපේක්ෂිත තත්ත්වයන් නිසා, ආරක්ෂක වියදම් ශීඝ්‍රයෙන් ඉහළ යාම සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා යෝජිත වියදම් වල ඉහළ යාම යන කරුණු නිසා රාජ්‍ය මූල්‍ය මෙන්ම ගෙවුම් තුලන යන මූලිකාංග ද සංශෝධනය කිරීමට සිදු විය. ඒ අනුව, 1988 අයවැය කථාවෙහි ප්‍රකාශයට පත් කරන ලද 1987 – 1990 සඳහා වූ මැදි කාලීන ප්‍රතිපත්ති රාමුවෙහි, 1987 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 21 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇති රජයේ ආදායම, 1988–1990 කාලපරිච්ඡේදයේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 20.5 ක් ලෙස පවතිනු ඇත. මේ අතර, වියදම පිළිබඳ ඉලක්කය වනුයේ, අනුක්‍රමයෙන් 1987 දී දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 33 ක සිට 1990 දී සියයට 29.5 දක්වා අඩු කිරීමය. මෙම සීමාවන් තුළ, දළ දේශීය නිෂ්පාදිතයෙහි අනුපාතයක් ලෙස වර්තන වියදම 1987 දී පැවති සියයට 20 සිට 1988–1990 කාලපරිච්ඡේදය තුළදී සියයට 18 දක්වා පහත වැටෙතැයි අපේක්ෂා කෙරේ. 1988 සිට 1990 දක්වා කාලපරිච්ඡේදය තුළදී දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් ප්‍රාග්ධන වියදම සියයට 13 සිට සියයට 11.5 දක්වා ක්‍රමිකව අඩු කිරීමෙන්, අයවැය හිඟයෙහි ක්‍රමානුකූල අඩු වීමක් අපේක්ෂා කෙරේ. මෙම රාජ්‍ය මූල්‍ය ගැලපීම් පදනම් කරගත් කල, දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් වශයෙන් ගෙවුම් තුලනයෙහි ජංගම ගිණුමේ හිඟය 1987 දී පැවති සියයට 9 සිට 1990 වන විට සියයට 5 දක්වා පහත වැටෙනු ඇතැයි බලාපොරොත්තු වේ. ගෙවුම් තුලනයේ මෙම ගැලපීම් සම්බන්ධයෙන්, නව කාර්මික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම, අපනයන දිරි ගැන්වීම සහ පෞද්ගලීකරණය පිළිබඳ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමෙන් පසුව අපනයනයන්හි සහ ආනයන ආදේශන අංශයන්හි සැලකිය යුතු වර්ධනයක් ඇතිවේයයි උපකල්පනය කෙරේ. කෙසේ වුවද, මෙසේ ප්‍රාග්ධන වියදමෙහි අඩු වීමෙන් ඇති වූ පාඩුව පිරිමසාලීම සඳහා පෞද්ගලික අංශය දිරිමත් කෙරෙන සුදුසු වාතාවරණයක් ඇති කළ යුතු වේ.

මෙම ප්‍රතිපත්ති රාමුවෙහි ඉලක්කයන්ට පදනම් වූ ප්‍රධාන උපකල්පනය වනුයේ ඉදිරි වර්ෂ කිහිපය තුළදී, ප්‍රශ්නය එහි ප්‍රධාන මූලාශ්‍රයෙන්ම විසඳෙන අයුරින් අයවැය හිඟය අඩුවන පරිදි සාර්ව ආර්ථික ගැලපීම් බෙහෙවින් යොදා ගත යුතු බවය. අයවැය හිඟය අඩු කිරීමෙහිලා යොදා ගනු ලබන ක්‍රියාමාර්ගයන් සම්පූර්ණයෙන් ක්‍රියාවට නැංවීම අත්‍යවශ්‍යය. ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික ප්‍රශ්ණ නිරාකරණය කිරීමටත්, ආර්ථිකයේ පවත්නා ව්‍යුහාත්මක අසමතුලිත-තාවයන් නිවැරදි කිරීමටත් කටයුතු කළ යුතුය. ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලංකාවේ සිදුවී ඇති ව්‍යුහාත්මක අසමතුලිතතාවයන් විශාල වශයෙන් හටගෙන ඇත්තේ ලබාගත හැකි සම්පත් සැළකිය යුතු ලෙසින් අභිබවා යන අන්දමේ වඩාත් වියදම් සහිත වැඩපිළිවෙලක් මගින් සංවර්ධනය කරා යොමු කිරීමේ උත්සාහයක් නිසාය. මූලික වශයෙන්ම ගෙවුම් තුලන හිඟයන් හා මිළ පීඩනය, ආර්ථිකය උද්ධමනකාරී නොවන පදනමක් මත පවත්වාගෙන යාමට අවශ්‍ය පමණට වඩා බෙහෙවින් වැඩි වේගයකින් දේශීය වියදම් වර්ධනය වීමෙන් ඇතිවන නොවැළැක්විය හැකි ප්‍රතිවිපාකයන්ය. තරඟකාරි හිමිකම්පෑම් සඳහා ඇති ඉල්ලුම් තත්ත්වය අවබෝධ කර ගන්නා අතරම, සාර්ව ආර්ථික සමතුලිතතාවයක් පවත්වා ගැනීමේ දැඩි අවශ්‍යතාවය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය විසින් නොසලකා හැරිය නොහැක. ආර්ථික වර්ධනය සම්බන්ධයෙන් සලකා බලන කල, රට මුහුණ පා ඇති බාධකයන් හඳුනා ගැනීම සඳහා අවශ්‍ය වන දර්ශනය, අධිෂ්ඨානය හා විනය ශ්‍රී ලංකාවට තිබිය යුතු අතර, ක්‍රමානුකූල ආකාරයකට අවශ්‍ය ගැලපීම් සිදු කළ හැකි පරිදි සිය කටයුතු කරගෙන යාමට රටට හැකි විය යුතුය. ජාත්‍යන්තර සහයෝගය ඇතිව ආර්ථික අභිවෘද්ධිය සඳහා ශ්‍රී ලංකාව දරණ ප්‍රයත්නයන් පිළිබඳ විශ්වාසය ශක්තිමත් කිරීමට මෙවැනි ක්‍රියාමාර්ග බෙහෙවින් දායක වනු ඇත.